# පුස්කොළ පොත් සංරක්ෂණ ක්‍රමවේද හා ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් සංරක්ෂිත ස්ථාන පිළිබඳ කෙටි සමාලෝචනයක්

- මාදිපොල විමලජෝති හිමි
- එන්. තුසිත රාජපක්ෂ

## ප්‍රවේශය

පුද්ගලයා සතු දැනුම මතු පරපුර උදෙසා විධිමත් ලෙස සම්ප්‍රේෂණය වන්නේ ලිඛිත මාධ්‍යයෙනි. ආදිතම යුගයන්හි දී සංකේතමය චිත්‍රාදිය මිනිසුන් තම අදහස් දැක්වීමට යොදාගෙන ඇති අතර කාලයාගේ ඇවෑමෙන් එම සංකේත භාවිතය අක්ෂර බවට පරිවර්තනය විය. ඉන් පසු පෙර අපරදිග ජනයා තම දැනුම ලේඛනගත කිරීමේ දී ශිලා ස්ථම්භ, ලෝහමය පුවරු ආදිය බහුලව භාවිත කළ බව පෙනේ. එහි දී තායිලන්තය, බුරුමය, ශ්‍රී ලංකාව වැනි සර්ම කලාපීය රටවල පාරම්පරික ලිඛිත මාධ්‍යයක් ලෙස පුස්කොළ පොත් බහුල වශයෙන් යොදාගෙන ඇත. ස්වභාවික තල්පත් යොදාගෙන පන්හිඳ ආධාරයෙන් පුස්කොළ ලේඛන සකස් කොට ඇත. පුස්කොළ අකුරු ලිවීමේ දී ප්‍රධාන වශයෙන් අනුගමනය කරන ශෛලීන් තුනකි.[1]

- හස්ති ශෛලිය
- හංස ශෛලිය
- කාක ශෛලිය

මෙහි හස්ති ශෛලිය ලෙස සැලකෙන්නේ තරමක් ලොකු අකුරු ලිවීමේ ක්‍රමයයි. හංස ශෛලිය යනු අලංකාර වටකුරු අකුරු වන අතර, කාක ශෛලිය නම් පැහැදිලි බවින් අඩු කටු අකුරු ලිවීමයි. මෙවැනි ලේඛන ක්‍රම භාවිත කර ගනිමින් පුස්කොළ ලේඛන ලියැවී ඇත. පෙර අපර උගතුන්ගේ දැඩි අවධානයක් යොමු වන පුස්කොළ පොත් ශ්‍රී ලංකාවේ පිළිගත් මූලාශ්‍රය විශේෂයකි. තල්පත් යොදාගනිමින් සකස් කරගන්නා මෙම මූලාශ්‍රය බුදුසමය ආශ්‍රිත තොරතුරු බෙහෙවින් ඉදිරිපත් කරන අතර එහි දී ත්‍රිපිටක සූත්‍ර ධර්ම, බෞද්ධ ඉතිහාසය,

විවිධ පූජනීය ස්ථාන හා වැදගත් සිද්ධි ඇතුළත් වී ඇත. ඉතිහාස විෂය ක්ෂේත්‍රයට අදාළව ද චරිතාපදාන, ඉඩම් පිළිබඳ සවිස්තර, වංශ කතා ආදිය පිළිබඳ තොරතුරු පුස්කොළ පොත්වල දක්වා ඇත. තව ද ගද්‍ය, පද්‍ය, පුරාවෘත, ගී, කාව්‍ය ආදිය ද මේවායෙහි දක්වා ඇත. සිංහල භාෂාව හා සබැඳි ව්‍යාකරණ, ශබ්දකෝෂ, ඡන්දස් ශාස්ත්‍රය, සිංහල අකාරාදිය මෙන් ම චිත්‍රකරුවන් පිළිපදින ලද නීතිරීති, සායම් සෑදීමේ පිළිවෙල ආදිය අඩංගු පුස්කොළ පොත් ද දැක්විය හැකිය.[2] තව ද යන්ත්‍ර, මන්ත්‍ර, නැකැත්, ජ්‍යොතිෂය, වාස්තු විද්‍යාව ආදි ක්ෂේත්‍ර ආශ්‍රයෙන් ලියැවුණු ලේඛන ද දැකගත හැක. පාලි, සංස්කෘත, සිංහල ආදි භාෂාවන්ගෙන් ලියැවී ඇති පුස්කොළ පොත් හා ලාංකේය බෞද්ධ ජන සමාජය අතර ඇත්තේ සමීප සබඳතාවකි.

පුස්කොළ පොත් හා සබැඳි පූජනීය වූත් වැදගත් ම ලේඛනගත කිරීම මාතලේ අළුවිහාරයේ දී වළගම්බා රාජ්‍ය සමයෙහි සිදුව ඇත. හෙළ අටුවා රචනා කිරීම, පාලි අට්ඨකථා රචනා වීම ලංකා ඉතිහාසයෙහි පුස්කොළ පොත් හා සබැඳි අවස්ථා අතර සුවිශේෂී තැනක් ගනී. දැනට ලංකාවෙන් හමුවී ඇති පැරණි ම පුස්කොළ පොත් 04 කි.

01. චුල්ලවග්ගය (කොළඹ ජාතික කෞතුකාගාරය)
02. විසුද්ධිමග්ග ටීකාව (පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය)
03. සාරත්ථදීපනී නම් විනය ටීකාව පළමු කාණ්ඩය (බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය)
04. සාරත්ථදීපනී නම් විනය ටීකාවේ පිටපත (පැරිස් නුවර ජාතික පුස්තකාලය)

ලාංකේය උරුමය ඉතා මැනවින් විදහාපාන පුස්කොළ පොත් ලේඛන වෙනත් මූලාශ්‍රයනට වඩා සුවිශේෂී වන්නේ මෙම ලේඛන ස්වාභාවික අමුද්‍රව්‍ය ආශ්‍රිතව සකස් කරගන්නා බැවිනි. එනිසා ම මෙම ලේඛන හානිවීමේ ප්‍රවණතාවය වැඩිය. එබැවින් එම ලේඛන විධිමත් ලෙස සංරක්ෂණය කළ යුතුය. එහි දී නිශ්චිත සංරක්ෂිත ක්‍රමවේදයනට අනුව එහි සංරක්ෂණ කාර්යය කිරීම සිදු කළ යුතුය. මෙහි දී පුස්කොළ පොත් සංරක්ෂණ ක්‍රියාවලියෙහි භාවිත වන සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳව විමසා බැලීමට අපේක්ෂා කෙරේ. නිසි ලෙස සංරක්ෂණය

කොට එම සංරක්ෂණය කරන ලද පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති ස්ථාන පිළිබඳව කෙටි විමසීමක් කිරීම ද මෙහිලා සිදු කෙරේ.

## පුස්කොළ පොත්වලට සිදුවන හානි

වසර දහස් ගණනක අතීතයක තොරතුරු සපයන පුස්කොළ පොත් නිසි සංරක්ෂණ ක්‍රමවේද ඔස්සේ විධිමත් අධීක්ෂණයකට ලක්වීමට හේතුව වී ඇත්තේ එහි පවතින ස්වභාවික තත්වය මත ඒවාට හානි විය හැකි ප්‍රවණතාවය වැඩි බැවිනි. පාරිසරික අමුද්‍රව්‍ය යොදාගෙන සකස් කරගන්නා පුස්කොළ විවිධ හේතු මත විනාශ වී යයි. ලාංකේය පුරාතන ලේඛන මාධ්‍ය ය වන ශිලා, ලෝහාදි මූලාශ්‍රයනට මෙම ගැටලුව නොපවතින බැවින් එම ලේඛනවලට සාපේක්ෂව පුස්කොළ පොත් සංරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමුවිය යුතුව ඇත. ප්‍රධාන වශයෙන් ම පුස්කොළ පොත් ආදි අත්ලිපි විනාශ කරන හායන කාරක 04 ක් දැක්විය හැක.[3]

01. ජීවවිද්‍යාත්මක හායනකාරක - දිලීර, පුස් හෙවත් ඇල්ගී, බැක්ටීරියා, පෙඳ, පාසි හෙවත් ලයිකන, කෘමින්, කෘන්තකයන් හා මිනිසා
02. භෞතික හායනකාරක - ආර්ද්‍රතාව, ආලෝකය, උෂ්ණත්වය, ගින්න, තෙතමනය, ජලය, පරිහරණය
03. රසායනික හායනකාරක - අම්ලතාව, තීන්ත, වායුගෝලය සහ වෙනත් පාරිසරික දූෂණ
04. ස්වාභාවික හායනකාරක - ආයුකාලය ඉක්මීම.

පුස්කොළ පොත් විනාශවීමේ හේතු සාධක ලෙස ස්වාභාවික පාරිසරික හේතු මෙන් ම මිනිසාගේ යම් යම් හේතු සාධක ද මුල් වන බව හඳුනාගත හැකිය. පුස්කොළ පොත් විනාශවීමේ ප්‍රධාන ම හේතුව වනුයේ එහි පවතින ඓතිහාසික වටිනාකම පිළිබඳ සමාජ අවබෝධය අඩුවීමයි. තල්පතෙහි පවතින මෘදු ස්වභාවය හා ඒ හා සබැඳි භෞතික ගුණය නිසා කාලයාගේ ඇවෑමෙන් තල්පත් හානි වන අයුරු දැකගත හැකිය. පුස්කොළ පොත් සඳහා සිදු වන පාරිසරික හානි අතර විවිධ කෘමි සතුන්ගෙන් සිදු වන හානි ඒ සඳහා

ඇති අභියෝගයකි. ජෛව හායනා කාරක දෙවර්ගයෙන් දැඩි ලෙස ව්‍යාප්ත වන හායනා කාරකය වන්නේ කෘමීන්ය. පුස්කොළ පොත් ආදි ලේඛනවලට හානි වන්නේ කාවා, සලබයා, කැරපොත්තා වැනි කෘමින්ගෙනි. කැරපොත්තන්ගෙන් වර්ග පහකින් පමණ පුස්කොළ ලේඛන වලට හානි සිදුවෙයි.

- ලේඛන කා දැමීම
- මල මූත්‍ර වැනි අපද්‍රව්‍ය පහ කිරීම
- බිජු දැමීම

ආදී හානි තුළින් පුස්කොළ පොත් විනාශ වී යයි. පුස්කොළ පොත්වලට හානි වන කෘමීන් අතර ගස්ට්‍රුලස් ඉන්දිකස් (Gastrullus indicus) යන කෘමි සත්ව විශේෂයෙන් ද හානි සිදුවෙයි. මෙම කෘමින්ගෙන් සිදුවන හානිය සිදුවීම කෙරෙහි මූලික වශයෙන් ම බලපාන්නේ නිශ්චිත ආරක්ෂිත තැම්පත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකිරීමයි. මීයන් වැනි සතුන්ගෙන් ද පුස්කොළ පොත්වලට හානි වන අවස්ථා දැකිය හැකිය. කෙසේ වුව ද පුස්කොළ පොත් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අවිධිමත් ලෙස අල්මාරි වැනි දෑවල අගුලු දා තැබීම ද සුදුසු කාර්යයක් නොවේ.

එසේ ආරක්ෂාව පිණිස අගුළු දා තැබීමෙන් එම පුස්කොළ පොත් කෙරෙහි අවධානය නොලැබී යාමෙන් නියමිත වාතාශ්‍රය නොලැබී යාම හේතු කොට ගෙන පුස්බැඳීම සිදුවිය හැක. එම පුස්බැඳීම තුළින් පුස්කොළ පැල්ලම් ආදිය සිදුව තල්පත් විනාශ වී යයි. පුස්කොළ ආදියෙහි අඩංගු වන යකඩ හා ලිග්නීන් පුස් හා දිලීර ඇති වීමට හේතුවෙයි. එබැවින් පුස්කොළ පොත් විධිමත් ලෙස ගබඩා කිරීම ද අත්‍යවශ්‍ය වෙයි.

පුස්කොළ පොත් විනාශ වීමේ ක්‍රියාවලියට මිනිසුන්ගේ ඇතැම් ක්‍රියාවන් හේතු වෙයි. පැහැරගැනීම, නුසුදුසු ලෙස පරිහරණය කිරීම, සටහන් තැබීම, පත්තිරු ගැලවීම, නැමීම, ඉරීම, දහඩිය දූවිලි තෙල් ආදිය සහිතව පත්තිරු පරිහරණය කිරීම තුළින් පුස්කොළ පොත් විනාශ මුඛයට ඇද දමයි. පුස්කොළ පොත්වලට සිදු වන භෞතික හායනකාරක ලෙස ජලය, උෂ්ණත්වය, ගින්න, වාතය, තාපය

ආදියෙන් සිදුවන හානි සඳහන් කළ හැක. නිසි ගබඩා කිරීමක් නොකිරීම නිසා වර්ෂාව ආදියෙන් පුස්කොළ පොත්වලට දැඩි හානි සිදුවෙයි. පත්තිරු ස්වාභාවික අමුද්‍රව්‍ය බැවින් පින්නෙන් ආදියෙන් ද හානි සිදුවේ. තල කොළ ඉතා මෘදු ස්වභාවයකින් යුක්ත බැවින් උෂ්ණත්වය තුළින් ද පුස්කොළ පොත් හානියට පත්වෙයි. උෂ්ණ බවට වැඩිපුර භාජනය වීම තුළින් පුස්කොළ පොතෙහි පත්තිරු ඉරි තැලී පත්තිරුවල කෙළවර කැඩී බිඳී ගොස් විනාශ වී යයි. උෂ්ණත්වය සේම ගින්නෙන් ද පුස්කොළ පොත් හානි වේ. පුස්කොළ පොතක් ගින්නෙන් දැවී ගියහොත් නැවත එය ලබාගැනීමට කිසිසේත් ම හැකියාවක් නොමැත. පුස්කොළ පොත කාබනික ද්‍රව්‍යයක් බැවින් ගින්නකට හසුවීමේ ප්‍රවණතාව වැඩිය. විශේෂයන් ම පුස්කොළ පොත් තබා ඇති ස්ථානවල විදුලි රැහැන් ආදිය තුළින් ගිනි ඇතිවීමෙන් පුස්කොළ පොත් හානි විය හැක. විවිධ ආක්‍රමණිකයන් විසින් හිතා මතා සිදු කරන ලද ගිනි තැබීම්වලින් ද පුස්කොළ පොත් විනාශ වූ අවස්ථා ලංකා ඉතිහාසයෙහි දක්නට ඇත.

පුස්කොළ පොත් විනාශ වන කාරකයක් ලෙස පාරිසරික දූෂණය ඇති කරන රසායනික භායනකාරකයන් ද දැක්විය හැක. පුස්කොළ පොත් ඇතුලු අත් පිටපත්වලට රසායනික හානිය ද නූතනයෙහි පවතින ගැටලුවකි. පත්තිරු එකිනෙක ඇලවීයාම, දිරායාම, ඉරීයෑම, මැකීයාම, ආදිය රසායනික ද්‍ර භාවිතයෙහි දී ඇතිවන අත්වැරදීම් මගින් සිදුවිය හැක. මෙහි දී පුස්කොළ පොත්වලට හානි කරන රසායනික වර්ග මොනවාදැයි ද හඳුනා ගත හැක. පෑඩ් තීන්ත, කාබන් තීන්ත, පැන්සල් රේඛා, වාර්නිස්, ලැකර්, දියසායම්, තෙල් සායම්, මේද, ඉටි, ග්‍රීස්, බැඳුම් ද්‍රව්‍ය (කෘත්‍රිම) මැලියම්, පාප්ප, තාර, දිලීර, තේ හා කෝපි, මලකඩ වැනි ද්‍රාවක ප්‍රධාන හානිකර වර්ණක ලෙස දැක්විය හැක. මෙලෙස පුස්කොළ පොත්වලට සිදු වන හානි සැකෙවින් දැක්විය හැකිය.

## පුස්කොළ පොත් සංරක්ෂණය හා ක්‍රමවේද

පුස්කොළ පොත් යනු ශ්‍රී ලාංකේය ඉතිහාසය අධ්‍යයනය කිරීමට ඇති මූලාශ්‍රයක් සේම එය ලාංකේය අනන්‍යතාවය ද ඉස්මතු කරන්නකි. පුස්කොළ පොත් සංරක්ෂණය පිළිබඳ හා එහි භාවිතය පිළිබඳ නෙල්

මහතා දක්වන්නේ මෙබඳු අදහසකි. "පුස්කොළ ග්‍රන්ථයන් පරිශීලනය සඳහා ලබා දීමේ දී එය පැරණි හෝ අලුත් ග්‍රන්ථයක් වේවා හැමවිට ම භාවිත කිරීමේ දී ප්‍රවේශම් සහිත විය යුතු අතර පත් ඉරු වෙන් නොකරමින් හා ග්‍රන්ථයට හානි නොකරමින් ප්‍රවේශමෙන් එය හැසිරවිය යුතු අතර කාලානුරූපව තෙල් දමා කළු මැදීමෙන් ග්‍රන්ථයට ඇති විය හැකි කැඩෙන සුළු හා භංගුර තත්ත්වයෙන් මඟ හරවා ගත හැකි වනු ඇත.[4] දේශීය අනන්‍යතාවය ඉස්මතු කෙරෙමින් ඓතිහාසික තොරතුරු සටහන් කොට ලියැවී ඇති පුස්කොළ පොත් විවිධ හේතු කාරක මගින් විවිධ හානිවලට ලක්වීම නිසා එහි චිරපැවැත්ම උදෙසා පුරාතනයෙහි සිට ම විවිධ ක්‍රමෝපායන් යොදා ඇත. එහි දී තල් ගොබය තෝරා ගැනීමේ සිට ම ක්‍රමානුකූල බවකින් යුක්තව ලේඛනය සකස් වීම සිදුවේ. තල්ගස ලකුණු කිරීම, ගොබය කැපීම, කුරු ඉවත් කිරීම, පළමු වට්ටු සැකසීම, කොළ තැම්බීම, කොළ මැදීම, දෙවන වට්ටු සැකසීම, කොළ තැම්බීම, කොළ මැදීම, සිදුරු විදීම, රත ගෑම, ලිවීම, කළු මැදීම, සුද මැදීම, මද අව්වේ වියළීම, පොත් කම්බා, හූය සකසා නිර්මාණය, පොත් බැඳීම, ගබඩා කිරීම, සංරක්ෂණය, පුස්කොළ ලේඛන කියවීම යන ක්‍රියාවලිය සිදුවේ. මෙ කාර්යයේ දී සංරක්ෂණ[5] කාර්යයට ලැබෙනුයේ ඉතා සුවිශේෂී ස්ථානයකි.

පුස්කොළ පොත්වල ආයු කාලය තරමක් අඩු බැවින් නිසි සංරක්ෂණයක් ඒ සඳහා තිබිය යුතුය. යම් සමාජයක ආගමික, සමාජයීය, දේශපාලනික හා සංස්කෘතික දත්ත පුස්කොළ පොත්වල ලේඛන ගත වී ඇති බැවින් යම් හේතු කාරකයන් තුළින් එම දත්ත විනාශ වීම සමස්ත සමාජයට ම බලපාන බැවින් පුස්කොළ පොත් ඇතුලු අත්පිටපත් සුරක්ෂිත කරගැනීම සඳහා 1931 දී රාජ්‍ය මැදිහත් වීම සිදු වී ඇත. 1931 ජනවාරි මස 17 වන දින ඊ. ඩබ්ලිව් පෙරේරාගේ යෝජනාවට අනුව හර්බට් ස්ටැන්ලි ආණ්ඩුකාරවරයා විසින් පුස්කොළ පොත් ඇතුලු අත්ලිපි සම්බන්ධයෙන් පත් කරන ලද ඓතිහාසික අත්ලිපි කොමිසමේ මූලික වගකීම් තුනකි.[6]

- සිවිල් ආගමික සාහිත්‍යමය හා ඉතිහාසය පිළිබඳ කරුණු හෙළිදරව් කරගන්නා වූ තවම ප්‍රකාශයට පත් නොවූ අත්ලිපිවල පැවැත්ම පිළිබඳව සොයා බැලීම.

- වටිනා ලේඛන තැම්පත් කර තැබීම.
- ආරක්ෂා කිරීම හා දිරාපත් වන එබඳු ලේඛන අළුත්වැඩියා කිරීම.

දේශීය අනන්‍යතාවය ඉස්මතු වන මූලාශ්‍රය විශේෂයක් වන පුස්කොළ පොත් සංරක්ෂණය කරගැනීම සඳහා රජයෙහි මැදිහත් වීම නිසා එහි සංරක්ෂණ කටයුතු විධිමත්ව සිදුවෙයි. එම සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා වර්තමානයෙහි මූලිකත්වය ගන්නා ආයතන කිහිපයකි.

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
- මධ්‍යම සංස්කෘතික අරමුදල
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

මෙම ආයතන ඇතුළුව පිළිගත් දේශිය ආයතන හරහා විධිමත් අධීක්ෂණයක් තුළ ශ්‍රී ලංකාව පුරා විහිදී ගිය විවිධ ස්ථාන සතු, පුද්ගලයන් සතු පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම සිදුවේ. මෙසේ පූර්ණ අධීක්ෂණයක් සහිතව පුස්කොළ පොත් සංරක්ෂණය සිදු කිරීමට හේතු වී ඇත්තේ නිසි පුහුණුවකින් තොරව පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම තුළින් එම පුස්කොළ පොත්වලට සිදුවන හානිය වළක්වා ගැනීම පිණිස ය. ඉතා කුඩා හෝ අත්වැරදීමකින් පවා පුස්කොළ පොත්වල පත්තිරුවලට හානි සිදුවිය හැකි බැවින් එම හානි වළක්වා මතු පරපුර වෙත පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම ඉතා මැනවින් සිදු කිරීමේ කාර්යභාරය මෙම ආයතන සිදුකරයි. මෙම ආයතනවල මගපෙන්වීමෙන් පුස්කොළ පොත් සංරක්ෂණ ක්‍රියාවලිය සිදු කිරීමේ දී මූලිකව ම කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි.

- ලේඛනයට සිදු වී තිබෙන හායනය හා හායනයෙහි ප්‍රමාණය හඳුනාගැනීම.
- අදාළ ද්‍රව්‍යයේ සංයුතිය පූර්ව සංරක්ෂණ හෝ ප්‍රතිසංස්කරණය කිරීම් ආදිය හඳුනාගැනීම.
- වැරදි ශිල්පීය ක්‍රම, කඩිනම් ක්‍රම, නොදත් රසායනික සංයුති ක්‍රම භාවිත නොකිරීම.

- ලේඛනයේ අක්ෂර හා ඒවායේ වර්ණය, තීන්ත හෝ වර්ණකාරකය මැනවින් හඳුනාගැනීම.
- ලේඛන ද්‍රව්‍ය නිසැකව හඳුනාගැනීම.
- පුස්කොළ හංගුර වී ඇත්ද ඉරි තැලී නැමී තිබේ ද, එය වෙළුමක් ලෙස තිබේ ද, බැඳුම් බැමි තිබේ ද, පොත් කම්බයෙහි තත්වය කෙසේ ද යනාදිය පරික්ෂා කිරීම.
- ලේඛනයෙහි අම්ලතාව හා පිටු අංක ගණනය කිරීම.

මෙම කරුණු කෙරෙහි මූලික අවධානය යොමු කොට සුදුසු පරිදි අදාළ පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම සිදුවේ. පුස්කොළ පොත් සංරක්ෂණයෙහිදී සාම්ප්‍රදායික සංරක්ෂණ ක්‍රම, නූතන විද්‍යාත්මක සංරක්ෂණ ක්‍රම භාවිත වුව ද බහුලව භාවිත වන්නේ සාම්ප්‍රදායික සංරක්ෂණ ක්‍රම වේ. තල්පත් ලිවීමේ ආරම්භයෙහි සිට ම ඒ සඳහා සංරක්ෂණ ක්‍රමෝපායන් යෙදීම සිදුවේ. තල්පතෙහි පැවැත්ම සඳහා බලපාන විවිධ ස්වභාවික ක්‍රමවේද යෙදීම සිදුවේ. ඉරටු ඉවත් කොට මැනවින් සකස් කරගත් තල්පත් තැම්බීම එහි ප්‍රථම අදියරයි. එයට නොමේරූ අන්නාසි කොළ (Ananas comosus), පැපොල් ගැට (Carica papaya) සහ පැපොල් කොළ, බෙලි කොළ (Aegle marmelos) සහ ගෙඩි, කැප්පෙටියා කොළ (Crotolaria retusa) හෝ පින්න කොළ (Clerodendrum pholomidis), බෝමු කොළ (Symplocos cordifolia) යනාදිය එක්කොට තැම්බීමෙන් තල කොළය නම්‍යශීලි කිරීමත්, කෘමි උවදුරින් ආරක්ෂා කිරීමත්, වර්ණවත් කිරීමත් සිදුවේ. මෙසේ සකස් කරගත් තල් පත්වල කල් පැවැත්ම සඳහාත්, ඉරි තැලී යාම වැළැක්වීම සඳහාත් තල්පත් තැම්බීමෙන් පසුව දින තුනක් පමණ සඳ එළිය සහිත වූ පින්නෙහි දින තුනක පමණ කාලයක් වියලා ගැනීම සිදුවේ. තව ද පුවක් දණ්ඩක හරහට දමා ඇදීමෙන් පදම් කිරීම ද සිදු කරයි. තව ද සකසා ගත් කොළ තදවන සේ රෝලක් සේ ඔතා දුම් වැදෙන මැස්සක තැබීම ද සිදු කරයි. එතුළින් පාවිච්චියට ගන්නා කාල පරිචය තෙක් ඉතා ම ආරක්ෂිතව එම කොළ තබාගැනීමට හැකිය.[7] මෙසේ කිරීම තුළින් තල්කොළයට තෙතමනයෙන් සිදු විය හැකි හානි වළක්වා ගත හැකිය. එබැවින් තල්පත්වල පුස් බැඳීම ඇතිවී විනාශ වීම වළක්වා ගත හැකිය. තව ද මෙය තල් කොළ විවිධ කෘමි සතුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා පුරාතනයෙහි යොදා ගත් එක් ක්‍රමවේදයකි. මෙම ක්‍රමවේදය නිසා ප්‍රයෝජනයට ගන්නා කාල වකවානුව තෙක් ඉතා

හොඳින් තල් පත් තබා ගත හැක.

යම් ලේඛනයක් සකස් කරගැනීමට අවශ්‍ය වූ විට සකස් කර ගත් තල් පත් අවැසි ප්‍රමාණයට කපාගැනීමෙන් පසු පුස්තකයක් බවට සකස් කරගැනීම සඳහා සිදුරු විද ගනියි. රත් කරන ලද යකඩ උලක් භාවිතයෙන් එම සිදුරු විදගන්නා අතර එම නිසා තල් කොලයෙහි ඇති වීමට හැකි ඉරීම්, සීරීම් වැළකී යයි. තව ද පොතක් බවට සකස් කර ගැනීමේ දී උල් කටුවෙහි කපු රෙදි කැබැල්ලක් ඔතා එය පොල් තෙලෙහි ගල්වා සාමාන්‍ය දැල්ලකින් පොත වටා පුළුස්සා ගැනීම සිදු කරයි. එමගින් ග්‍රන්ථයට දූවිලි හා කෘමි සතුන් ඇතුලු වීම වැළකෙයි.[8] පුස්කොළ පොත සකස් කිරිමේ දී යොදා ගන්නා මෙවැනි ස්වාභාවික ක්‍රමවේද ග්‍රන්ථයෙහි ස්වාභාවික ගුණය සුරක්ෂිත වීමට ද හේතුවෙයි. තව ද පුස්කොළ පොත් සකසා ගැනීමේ දී යොදා ගන්නා කම්බා ද පුස්කොළ පොත් දිගු කලක් ආරක්ෂා වන පරිදි යොදා ගනියි. මෙහි දී ලී කම්බා යොදා ගැනීම තුළින් තෙතමනයෙහි රැඳා පැවතීමක් ඇති නොවේ. එම නිසා තෙතමනය රැඳීම නිසා ඇති වන පුස් බැඳීමෙන් වැළකෙයි. තව ද මේ කාර්යයන්හි දී කපු නූල් යෙදීම තුළින් ද සිදුර ආශ්‍රිතව ඇතිවිය හැකි පළුදුවීම් ආදිය ඇතිවීමක් නොවී පත්තිරු ආරක්ෂා වේ.

මෙසේ සකස් කරගත් තල් පත්වල අකුරු මතු කර ගැනීම පුස්කොළ පොත් සකසා ගැනීමේ කාර්යයෙහි ඇති සුවිශේෂීම අංගයක් වෙයි. පන්හිඳ භාවිත කොට අකුරු ලීවීමෙන් පසුව කළු මැදීම මගින් අකුරු මතු කරගැනීම සිදු කරයි. එහි දී ද යොදාගන්නේ දේශිය වශයෙන් යොදා ගන්නා අමුද්‍රව්‍ය වීම සුවිශේෂී වේ. කපු ගසෙහි කොළ පුළුස්සා ලබා ගත් අළු දුම්මල තෙල් සමග මිශ්‍ර කර එය ඝන ආලේපයක් ලෙස තල්පතෙහි ආලේප කිරීමෙන්, රෙදි පුළුස්සා ගත් අළු දුම්මල තෙල් සමඟ මිශ්‍ර කොට ආලේප කිරීමෙන්, දුම්මල තෙල් සමග ගැඬුඹ ගසෙහි පොතු වේලා කුඩු කර සකස් කරගත් මිශ්‍රණය ආලේප කිරීමෙන් වැන්නකින් පන්හිදෙන් මතු කරගත් අක්ෂර වර්ණ කරගනී. එසේ එක් ආකාරයකින් අකුරු කළු කරගැනීමෙන් පසු දහයියා කුඩු, කුරක්කන් පිටි වැනි දේකින් අවශේෂ ද්‍රව්‍ය ඉවත් කොට ඉතා පිරිසිදු ලෙස තල්පත් මැදගැනීම සිදු වේ. මෙසේ කළු මැදීම සඳහා යොදාගන්නා ස්වභාවික ක්‍රමවේද පුස්කොළ පොතෙහි පැවැත්මට හේතු වේ.

මෙසේ පුස්කොළ පොත් සැකසීමේ දී එහි පැවැත්ම සඳහා විවිධ ක්‍රමෝපායන් යෙදුව ද කාලයාගේ ඇවෑමෙන් පාරිසරික හා මිනිසාගේ බලපෑම් මත බොහෝ අවස්ථාවල පුස්කොළ පොත් හානි වීම සිදු වේ. එබැවින් සකස් කරන ලද පුස්කොළ පොත්වල සුරක්ෂිත බව සඳහා ද විවිධ සංරක්ෂණ ක්‍රමවේද යොදනු ලැබේ. එම ක්‍රමවේද අතර,

- පරික්ෂා කිරීම, චලනය කිරීම, වාතය සංසරණය වීමට සැලැස්වීම ආදි දෛනික ක්‍රියාකාරකම්
- දුම්මල තෙල් ගැල්වීම, සැවැන්දරා මුල්, කරාබු නැටි, ආදි දේශීය කෘමි ප්‍රතිරෝධක ද්‍රව්‍ය තැබීම.
- කොහොඹ දැව අල්මාරි, රාක්ක වැනි සුරක්ෂිත ස්ථානයක ආරක්ෂා සහිතව පුස්තකාල විද්‍යාත්මක ක්‍රම අනුව තැම්පත් කර තැබීම.
- ප්‍රවේශම්කාරි ලෙස විධිමත්ව පරිහරණය කිරීම.[9]

යනාදි ක්‍රමවේදයන් ඉතා සංක්ෂිප්තව දැක්විය හැක. කෙසේ නමුත් පුස්කොළ පොත් සුරක්ෂිත කරගැනීම සඳහා පළිබෝධ සංරක්ෂණ ක්‍රම භාවිත කිරීම ප්‍රකටව දැකිය හැකි රක්ෂණ ක්‍රමවේදයකි. පුස්කොළ පොත් සඳහා භාවිත කළ මූලික සංරක්ෂණ ක්‍රමවල දී ස්වභාවික ඖෂධීය කෘමි ප්‍රතිරෝධක භාණ්ඩ හා ද්‍රව්‍ය භාවිත වේ. ඉතා දැඩි දැව වර්ගයන්ගෙන් හෝ ලෝහ වර්ගයන්ගෙන් ඇත් දත් වැනි ද්‍රව්‍යවලින් කළ පොත් කම්බා යෙදීමත් ආරක්ෂිත ගබඩා ස්ථානවල පුස්කොළ පොත් තැම්පත් කිරීමත් ඒ අතර වෙයි.

විවිධ කෘමි සතුන් මගින් පත්තිරුවලට වන හානිය වළක්වා ගැනීම සඳහා යම් යම් උපක්‍රම යෙදීම සංරක්ෂණ ක්‍රියාවලියෙහි දී සිදුවේ. මෙවැනි උපක්‍රමශීලි ක්‍රමවේද තුළින් භෞතික මෙන් ම රසායනික හානි වළක්වා වසර ගණනාවක් පුරා පුස්කොළ පොත් රැකගැනීමට හැකිවී ඇත. එසේ පළිබෝධවලින් ආරක්ෂා කරගැනී ම සඳහා පුස්කොළවල දුම්මල තෙල්, දූදූ තෙල්, දේවදාර තෙල්, පැඟිරි තෙල්, දොරණ තෙල්, කරාබු නැටි තෙල්, කුරුඳු තෙල් වැනි තෙල් වර්ග කීපයක්ම පුස්කොළ පොත්වල ගැල්වීම හා කපුරු කුට්ටි හෝ බෝල, කරාබු නැටි, කිරළ ඇට මඳ, සැවැන්දරා මුල්, කොහොඹ කොළ ආදි ඖෂධීය

ස්වාභාවික ද්‍රව්‍ය පුස්කොළ පොත් තැම්පත් කර ඇති ස්ථානවල හෝ අල්මාරි, පෙට්ටගම්, රාක්ක ආදියේ තැබීම[10] සිදු කොට ඇත. මෙම ක්‍රමවේදය තුළින් කෘමි සතුන් ආදින්ගෙන් පුස්කොළ පොත් ආරක්ෂා කරගැනීමට හැකියාව පවතී. පුස්කොළ පොත් සංරක්ෂණයේ දී විවිධ කෘන්තකයින්ගෙන්, කෘමි සතුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ද විවිධ ක්‍රම භාවිත කරයි. පුස්කොළ පොත්වල ජෛවීය සතුරන් වන කැරපොත්තන්, ගුල්ලන්, වේයන්, සලබයන්, මීයන් ආදි සතුන් වඳ බවට පත් කිරීම සඳහා එම සතුන් වාසය කරන ස්ථානවලට විවිධ රසායනික ද්‍රව්‍ය භාවිත කරයි. කෘමින්, කෘන්තකයින් පුස්කොළ පොත් ආක්‍රමණය කර ඇත්නම් ඩිඩීටි, ග්‍රැමෙක්ෂන්, මර්කියුරික් ක්ලෝරයිඩ්, පෙන්ටක්ලෝරෝෆිනොල් සහ ඩයිසෝඩියම් ලවණ සහිත කෘමිනාශක යෙදීම සිදු කරයි.[11] එහි දී එම රසායනික ද්‍රව්‍ය සුදුසු ප්‍රමාණයෙන් ගෙන එම කාර්යය සිදු කරයි.

තව ද කාවන් වැනි සතුන්ගෙන් පුස්කොළ පොත් ආරක්ෂා කරගැනීම සඳහාත්, තල්පත්වල නම්‍යශීලි බව ආරක්ෂා වීමටත් දුම්මල තෙල් යොදා ගනිමින් කාලයෙන් කාලයට මැදීම සිදු කරයි.

සුදුසු උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාව පවත්වා නොගැනීම ආදි පාරිසරික බලපෑම්හි ප්‍රතිඵලයක් ලෙස ද පුස්කොළ පොත් විනාශ වේ. වායුසමනය කිරීමෙන් මේ තත්වය අවම කරගත හැකි වුවත් පුස්කොළ ලේඛන තැම්පත් සියලු ම ස්ථාන සඳහා වායු සමීකරණ යන්ත්‍රාදිය සවිකිරීමේ හැකියාවක් නොපවතී. දිලීර, බැක්ටීරියා, ඇල්ගී ආදියෙන් හානිවී විනාශයට පත් වන පුස්කොළ පොත් ආරක්ෂා කර ගැනීම සඳහා සිදු කළ හැකි සරල ක්‍රම කීපයක් දැක්විය හැක.

- වාතය ලැබෙන පරිදි පුස්කොළ පොත් තබා ඇති ස්ථානයන්හි වා කවුළු ආදිය විවෘත කර තැබීම.
- ලේඛන තබා ඇති ස්ථානය නිතර පිරිසිදු කිරීම.
- ලේඛන තැන්පතුව වරින් වර චලනය වන පරිදි වෙනස් කිරීම.

මේ අයුරින් එදිනෙදා සිදු කළ හැකි ක්‍රියා තුළින් පුස්කොළ පොත් සුරක්ෂිත කරගැනීමේ හැකියාව පවතී. පුරාතනයේ පටන් ම පුස්කොළ පොත් අසුරා තැබීමේ දී පවා එහි ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වී

ඇත. එහි දී රතු වැනි වර්ණයකින් යුතු කපු ලේන්සු මගින් පුස්කොළ පොත් ඔතා තැබීම සිදු කර ඇත. මෙම ලේන්සුව බණබස්නය[12] නමින් හඳුන්වා ඇත. මෙසේ ඔතා තැබීම මගින් කෘමි සතුන්ගෙන්, දූවිල්ලෙන් පුස්කොළ පොත් ආරක්ෂා කරගත හැකිය.

පුස්කොළ පොත් සංරක්ෂණයේ දී ධූමායනය කිරීම සිදු කරයි. පුරාතනයේ දී කොහොඹ තෙල් බිංදු කීපයක් ගිනි අඟුරු මතට දමා එයින් නිකුත් වන සැර සුගන්ධය පුස්කොළ තැන්පතුවලට වැදීමට සැලැස්වීමෙන්[13] කෘමින් හා පුස් ඇති වීමට හේතුකාරක වන හායනකාරක මගින් වළක්වා ගෙන ඇත. නවීන ලෝකය තුළ ද ධූමායනය කිරීම ක්‍රම දෙකකට සිදුවේ.

- රික්ත ධූමායනය
- ධූමායන පෙට්ටි ධූමායනය

කෘමි සතුන්ගෙන් ලේඛනවලට හානි සිදු වී ඇති විට රික්ත ධූමායනය සිදු කරයි. කාමරයක වාතය ශූන්‍ය කර අවශ්‍ය පරිදි සුදුසු උෂ්ණත්වය තබා ලේඛන අසුරා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කොට ධූමායනය සිදු කරයි. මීට අමතරව පෙට්ටි ධූමායනයේ දී මල නොබැඳන ලෝහ පෙට්ටි, ශක්තිමත් බවින් වැඩි දැව වර්ගවලින් තැනූ පෙට්ටි ආදිය භාවිත කොට ධූමායනය සිදු කරයි. සුදුසු ප්‍රමාණයෙහි මෙම පෙට්ටිවල තට්ටු සිදුරු සහිත විය යුතු අතර වාතය පිට නොවන පරිදි වැසිය යුතුය. අතර එහි පුස්කොළ පොත් අදාළ රසායන වලින් ධූමායනය සිදු කරනු ලබයි. විදුලි බුබුළුවලින් ධූමායනය සතියක් කර, සති තුනක පමණ නිරෝධායන කාලයකින් අනතුරුව නැවත සතියක් ධූමායනය කිරීම සිදු කරයි.

පුස්කොළ පොත් සංරක්ෂණ වීම සඳහා සුදුසු ස්ථානයන්හි සුදුසු පරිදි තැම්පත් කිරීම ද අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ම පුස්කොළ පොත්, ලීයෙන් තැනූ අල්මාරිවල, පෙට්ටගම් ආදියෙහි තැම්පත් කිරීම සිදු කරයි. සුපරික්ෂාකාරිව ඒවා පරිහරණය කිරීම තුළින් පුස්කොළ පොත් දිගු කාලයක් තබා ගත හැකිය. මෙසේ තැම්පත් කර තැබීමෙන් පුස්කොළ පොත් ආරක්ෂා කරගන්නා සේම පුස්කොළ එක් තැනකින් තවත් තැනකට රැගෙන යාමේ දී පවා එහි ආරක්ෂාව වෙනුවෙන් ඒ සඳහා කොට්ට උරයක් වැනි පැසක් තිබී ඇත. මෙය පොත් පැසය

නමින් හැඳින්වූ දික් හැඩැති උරයකි.[14] මෙසේ පුස්කොළ පොත් සැකසීම සඳහා තල්පත් ලබාගැනීමේ සිට ම විවිධ සංරක්ෂණ ක්‍රමවේද ඒවායෙහි චිර පැවැත්ම සඳහා භාවිත කළ බව පෙනේ.[15]

## පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති ස්ථාන

පුරාතන පුස්කොළ පොත් ශ්‍රී ලංකාව පුරා විහිදී ඇත. විවිධ පුද්ගලයන්, ආයතන මුල්වී එම ලේඛන ආරක්ෂා කරගැනීම නිසා වර්තමානය වන විට ද එම ලේඛන මූලාශ්‍රය වශයෙන් භාවිත කිරීමේ හැකියාව පවතී. ශ්‍රී ලංකාවෙන් හමුවන පුස්කොළ බහුතරය බෞද්ධ පූජනීය ස්ථාන සතු ලේඛන වෙයි. මෙම ලේඛන මතු පරපුර සඳහා ආරක්ෂා කර ගැනීමේ මූලිකත්වය භික්ෂූන් වහන්සේලා විසින් දරා ඇති අතර තම විහාරස්ථාන තුළ එම ලේඛන තැම්පත් කොට ගනිමින් සුවිසල් ඓතිහාසික දැනුම් සම්භාරයක් වර්තමානයට දායාද කොට ඇත. කේ. ඩී සෝමදාස මහතාගේ "**ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය**" ග්‍රන්ථයෙහි ප්‍රථම භාගය[16] කොටසෙහි ඒ සඳහා ඇතුළත් වූ පුස්කොළ පොත් ලැයිස්තු පළාත් වශයෙන් බෙදා දක්වා ඇත.

| පළාත | ලැබුණ ලැයිස්තු ගණන | පුස්කොළ පොත් ගණන |
|---|---|---|
| බස්නාහිර පළාත | 173 | 5341 |
| මධ්‍යම පළාත | 127 | 5345 |
| දකුණු පළාත | 431 | 28306 |
| උතුරු පළාත | - | - |
| නැගෙනහිර පළාත | - | - |
| වයඹ පළාත | 55 | 1369 |
| උතුරු මැද පළාත | 15 | 691 |
| ඌව පළාත | 35 | 1500 |
| සබරගමු පළාත | 77 | 1777 |
| ප්‍රමාණය | ලැයිස්තු 913 | පිටපත් 44329 |

ඒ අතර ඒ වන විට එතුමාට ලැබුණු පුස්කොළ පොත් ලැයිස්තු අතුරින් වැඩි ම පුස්කොළ පොත් සංඛ්‍යාවක් ලැබී ඇති ස්ථාන ලෙස,

- හඟුරන්කෙත පොත්ගුල් විහාරය
- බළපිටියේ වැලිතර අම්බරුක්ඛාරාමය
- මහනුවර පත්තිරිප්පුවේ ප්‍රාචීන පුස්තකාලය
- වැලිගම් කෝරළයේ වැලිහිඳ ශ්‍රී සුදර්ශනාරාමය
- මාතර හිත්තැටියේ රජමහා විහාරය
- මාතර නාඳුගල වටගෙදර ශ්‍රී සුධර්මාරාමය

යන ස්ථාන දක්වා ඇත. ලේඛන වැඩි ම ප්‍රමාණයක් හමුනොවුණ ද ඉතා වටිනාකමින් යුක්ත පුස්කොළ පොත් බොහෝ ප්‍රමාණයක් ලංකාවේ විවිධ ස්ථාන වල ඇත. මාතලේ අලුවිහාරය වැනි ස්ථානවල එම ලේඛන විහාරස්ථාන සතු පූජනීය වස්තූන් ලෙස තැම්පත් කොට ඇත්තේ සම්බුද්ධ භාෂිතය තැම්පත්ව ඇති ලේඛන බැවිනි. මෙම ස්ථානවලට අමතරව අස්ගිරි මහා විහාරීය විජයසුන්දරාරාමය, මුල්ලේගම පන්සල, ගෙඩිගේ විහාරය, මැද පන්සල,[17] පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය, මහනුවර සංඝරාජ කෞතුකාගාරය, ජම්බුගහපිටිය දලුකේ පුරාණ විහාරය, කවටයාමුන පුරාණ විහාරයේ පුස්තකාලය, නැලව පොත්ගුල් විහාරයේ පුස්තකාලය, අලුත්නුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරයේ පුස්කොළ පොත්, පස්ගම රජමහා විහාරයේ පුස්තකාලය, තොල්ලාගල පුරාණ විහාරය, හිඟුල රජමහා විහාරය, ගල්පිහිල්ල රජමහා විහාරයේ පුස්තකාලය ආදි ලංකාවේ බොහෝ ස්ථානවල පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති අතර එයින් ස්ථාන කීපයක් පිළිබඳ පමණක් මෙහි අවධානය යොමු වේ.

ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් සංරක්ෂිත ස්ථාන පිළිබඳ අවධානය යොමු කිරීමේ දී අස්ගිරි මහා විහාරයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. අස්ගිරි විජයසුන්දරාරාමය, මුල්ලේගම පන්සල සහ ගෙඩිගේ විහාරයේ සංරක්ෂිතව පවතින පුස්කොළ පොත් රාශියක් දැකිය හැක. ඒ අතර බුදු දහම හා බැඳුණු කෘති ගණනාවක් පවතී. වෙද පොත්, ඉතිහාස පොත් සාහිත්‍ය පොත්, ආදිය ද එම එකතුවලට අයත් වේ. එම පුස්කොළ පොත් අතර අංගුත්තර නිකාය, අංගුලිමාල සූත්‍රය, අභිධර්මකථා සංග්‍රහය, අභිධර්මවිභංග ප්‍රකරණය, උපාසක ජනාලංකාරය, උපෝසථ සූත්‍ර ව්‍යාකරණාඛ්‍යානය, උම්මග්ග ජාතකය, ඔකඳපොල සන්නය, කච්චායනය, කච්චායන ධාතු මංජුසාව,

කච්චායන වර්ණනාව, කථාවස්තුප්‍රකරණය, කර්මවිභංග ජාතකය, ඇස් වෙද පොතක්, කාය විරති ගාථා සන්නය, කාලාකාරාම සූත්‍රය, කාරක ප්‍රශ්නාවලී, කාව්‍යාදර්ශය, කුරු ජාතකය, කුරු ධර්මය, කුසල සූත්‍ර දේශනාව, කෝසල බිම්බ වර්ණනාව, ගෙඩි වෙද පොත, ගුත්තිල කාව්‍ය, චුල්ලවග්ග (බුරුම), චූලසීහනාද සූත්‍ර පද වැනුම, ජනුස්සති සූත්‍ර සන්නය, ජාතකට්ඨ කථා, ජාතක ගාථා සන්නය, ජාතක සරණය, ජාතක රත්නය, ජිනවංශය, ජිනාලංකාර ටීකා, තඹපත් පොතක්, ථූපවංශය, දණ්ඩනල අලංකාරය, දම්පියා අටුවා ව්‍යාඛ්‍යානය, දම්පියා ගාථා සන්නය, දානානිසංසය, දුක්‍යඛ්‍යානය, පපංචටීකා, පද්මාවති කථාව, පද ඇනුම් පොත, පදසාධන සන්නය, පදසාධන ටීකාව, පාරාජිකා පොත් වහන්සේ, පාලි නිගණ්ඩු සන්නය, වාසගම් බණ පොත, විනයාලංකාරය, විමතිවිනෝදනී ටීකාව, විශාඛාවත[18] ආදි පොත් සමූහයක් ඇතුළත් වෙයි. පුස්කොළ පොත් සංරක්ෂිත ස්ථානයක් වන අස්ගිරි විජයසුන්දරාරාමය පුස්කොළ පොත් අධ්‍යයනය කිරීමේ දී වැදගත් තැනක් ගනී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය ද පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති සුවිශේෂී ස්ථානයකි. වර්තමානය වන විට පුස්කොළ පොත් සංරක්ෂණ මධ්‍යස්ථානයක් ද මෙහි ස්ථාපිත වීම තුළින් පුස්කොළ පොත් සංරක්ෂණය වීම ඉතා මැනවින් සිදුවේ. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය සතුව ජාතක පොත් වහන්සේ, සද්ධර්මරත්නාවලිය, විසුද්ධිමග්ග පාලිය, අංගුත්තර නිකායට්ඨකථා, මහාවංශය, දම්පියා අටුවා ගැටපදය, චුල්ලවග්ගපාලිය, මහාවග්ගපාලිය, බුත්සරණ, අංගුත්තර නිකායට්ඨකථා, වෙස්සන්තර ජාතකය, ආදි පුස්කොළ පොත් 4000 කට ආසන්න ප්‍රමාණයක් ඇති අතර විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ විහිදී ගිය ලේඛන ඒ අතර වෙයි. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය මගින් ද ලංකාවේ විවිධ පළාත්වල ඇති ත්‍රිපිටකයට අයත් පුස්කොළ පොත්වල එකතුවක් ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතියක් සිදුකරගෙන යනු ලැබේ.[19] නූතන තාක්ෂණය භාවිත කරමින් අනාගතය සඳහා මෙම වටිනා ග්‍රන්ථ ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් කොට සැලකිය හැක. එමගින් බොහෝ ප්‍රමාණයකට ඉතා පහසුවෙන් කුමන ස්ථානයක සිට හෝ එම ලේඛන අධ්‍යයනය කිරීමේ හැකියාව උදා වී ඇත. තව ද කැලණිය

විශ්වවිද්‍යාලය මගින් ද මෙබඳු ව්‍යාපෘතියක් සිදුකර එම ඩිජිටල්කරණය කරන ලද පිටපත් එම විශ්වවිද්‍යාලයේ ද සංරක්ෂණය කර තිබේ.

පුස්කොළ පොත් සංරක්ෂණ කාර්යයේ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සුවිසල් කාර්යභාරයක් සිදු කරන අතර ඊට අනුබද්ධ ශාඛා මගින් විධිමත් පුහුණුවක් ලැබූ නිලධාරීන් විසින් එම සංරක්ෂණ කාර්යය සිදු කරයි. එසේ සංරක්ෂණය කරන ලද පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති ස්ථාන බොහෝ ප්‍රමාණයක් ලංකාව පුරා විහිදී ඇත. එසේ පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති ස්ථාන කීපයක් පිළිබඳ සඳහන් කළ හැක. ඒ අතර ජම්බුගහපිටිය දලුකේ පුරාණ විහාරය සඳහන් කළ හැක. ජාතක පොත, මජ්ඣිම නිකාය, දීඝ නිකායට්ඨකථාව, මනෝරථපූරණී, විනය විනිස, දීඝ නිකාය, රසවාහිනි, විනය විනිශ්චය, විමානවත්ථු, මිලින්ද ප්‍රශ්නය, නිමි ජාතකය, පාලි මුක්තක විනය අටුවාව, මජ්ඣිම නිකායට්ඨකථා, මන්ත්‍ර පොත ආදි පුස්කොළ පොත් එහි තැම්පත්ව ඇත. කවටයාමුණ පුරාණ විහාරයෙහි පුස්තකාලය ද පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති ස්ථානයකි. ඛුද්දක නිකාය, පූජාවලිය, මිලින්ද ප්‍රශ්නය, ශීල පරිච්ඡේදය, චතුබණවර පාලි, බණදහම් පොත, ථූප වංශය, කවි පොත, දළඳා පූජාවලිය, ජෝතිය සිටාණන්ගේ කතා වස්තුව, අභිධානප්‍රදීපිකාව ආදි පුස්කොළ පොත් සමූහයක් සංරක්ෂණය කොට එහි තැම්පත්ව ඇත. නැලව පොත්ගුල් විහාරයෙහි ද සද්ධර්මාලංකාරය, විනයට්ඨකථා, විමානවත්ථු, දේවදූත සූත්‍රය හා බණදහම් පොත, සතරබණවර අටුවාව, දම්සක් පැවතුම් සූත්‍රය, බ්‍රහ්මජාල සූත්‍රය, දම්පියා අටුවා ගැටපදය, නකුල කථාව, සිඟාලෝවාද සූත්‍රය, භික්ෂු ප්‍රාතිමෝක්ෂය ආදි පුස්කොළ පොත් රාශියක් සංරක්ෂිතව පවති. අලුත්නුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරයෙහි ද පන්සිය පනස් ජාතක පොත, මිලින්ද ප්‍රශ්නය, පූජාවලිය, විභංග පකරණය, කථාවත්ථුප්‍රකරණය, සද්ධර්මරත්නාකරය, ධම්මප්‍රදීපිකාව, සතර කමටහන්, සාලෙය්‍යය සූත්‍රය ආදි පුස්කොළ පොත් සංරක්ෂණය වී ඇති ස්ථානයකි. පුස්කොළ පොත් සංරක්ෂණය වී ඇති ස්ථානයක් ලෙස පස්ගම රජමහා විහාරය දැක්විය හැකි අතර සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, වේරංජය සූත්‍රය, ධම්මචක්කය හා වෙනත්, සච්චවිභංග සූත්‍රය, ධම්මපදට්ඨකථාව ආදි පුස්කොළ පොත් සමූහයක් එහි තැම්පත්ව ඇත.[20]

ඉහත කෙටියෙන් අධ්‍යයනය කළ ආකාරයට ලක්දිව පුස්කොළ පොත් සංරක්ෂිතව ඇති ස්ථාන බොහෝ ප්‍රමාණයක් දක්නට ලැබේ. එහෙත් මෙහි දී තත් සියලු ස්ථාන පිළිබඳ අධ්‍යයනය සිදු නොකෙරේ. අතීතයේ ඇතැම් විහාරස්ථාන පොත්ගුල් විහාර වශයෙන් හඳුන්වමින් පුස්කොළ පොත් සංරක්ෂිතව පවත්වාගෙන ගිය ආකාරයක් දක්නට ලැබේ. දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ද අවධානයට පත් පොළොන්නරුවේ පිහිටි පොත්ගුල් වෙහෙරෙහි පොත්ගුල එසේ පොත් සංරක්ෂිත ස්ථානයක් ලෙස පැවති බව සඳහන් කළ හැක. මෙසේ පොත්ගුල් පැවැති බොහෝ ස්ථාන ලංකාව පුරා විහිදී ඇති අතර පුරාවෘතයන්හි කියවෙන පරිදි වළගම්බා රජ සමයෙහි සිට පැවත එන අටුපොත්දෙණිය පොත්ගුල් විහාරය හා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා සබැඳි කථා ප්‍රවෘත්තියක් වෙයි. එනම්, මෙම පොත්ගුල් විහාරයෙහි සිට මාතලේ අළුවිහාරයෙහි සිදු කළ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ කාර්යය සඳහා භාවිතයට ගත් පුස්කොළ පොත් සකස් කිරීම මෙම විහාරස්ථානයෙහි සිට සිදු කර ඇති බවයි.[21] එහි සත්‍ය අසත්‍යතාව කෙබඳු වුව ද ලංකාවෙහි පොත්ගුල් විහාර මගින් පුස්කොළ පොත් සංරක්ෂණය වූ බව පැහැදිලි වේ.

වර්තමානයේ මෙම වටිනා පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම ජාතික වගකීමක් වන අතර තත් කාර්යය නූතන තාක්ෂණය භාවිත කරමින් සිදු කිරීම කාලෝචිතය.

## සමාලෝචනය

ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමේ මූලාශ්‍රයක් ලෙස පුස්කොළ පොත් හැඳින්විය හැක. මෙම දේශීය මූලාශ්‍රය අතීත මිනිසාගෙන් උරුම වූ දායාදයක් වන අතර ඒවායෙහි ස්වාභාවික ගුණය නිසා විවිධ හානි වලට පත්වීමේ අවස්ථාව වැඩිය. පාරිසරික හා මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් නිසා මෙම මූලාශ්‍රය විනාශ වීමට හේතු වෙයි. එබැවින් පුස්කොළ පොත් ආරක්ෂා කරගැනීමට විවිධ ක්‍රමවේද පුරාතනයෙහි පටන් ම යොදාගෙන ඇත. සාම්ප්‍රදායික හා විද්‍යාත්මක ක්‍රමවේද ඒ සඳහා යොදා ගත්ත ද එහි වැඩි වශයෙන් සාම්ප්‍රදායික සංරක්ෂණ ක්‍රමවේදවලට මුල්තැනක් ලැබේ. එම සංරක්ෂණ ක්‍රම යොදාගෙන

සංරක්ෂණය කරන ලද පුස්කොළ පොත් සංරක්ෂිත ස්ථාන ලංකාව පුරා විහිදී ඇත. එම ස්ථාන සතුව සුවිසල් පුස්කොළ පොත් එකතුවක් ඇති අතර එම ලේඛන ශ්‍රී ලංකාවේ දේශීය අනන්‍යතාවය ඉස්මතු කරන මූලාශ්‍රය ලෙස සඳහන් කළ හැක.

## ආන්තික සටහන්

1. පුස්කොළ ලේඛනවල විශේෂ ශිල්පීය ක්‍රම, සෝරත හිමි, ලෙනදොර, **සාරථී,** මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, 2004, 13 පිටුව.
2. පර්යේෂණ මූලාශ්‍ර වශයෙන් පුස්කොළ පොත්වල ඇති වැදගත්කම, චම්පා එන්. කේ. අලහකෝන්, මහාචාර්ය **පී. බී. මීගස්කුඹුර උපහාර,** සංස්: පාලිත ලක්ෂ්මන් නුගපිටිය ආදිහු, 2008, 661 පිටුව.
3. ලගමුව, ආරිය., **ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව,** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2006, 313 පිටුව.
4. Nell, Andreas. —Palm-Leaf Manuscripts or Ola Books, *Ceylon Today 3&4 (March-April 1954), p. 40.*
5. "සංරක්ෂණය යනු පිරිරක්ෂණය හා ප්‍රතිසංස්කරණය යන අංග දෙකෙන් සමන්විත විද්‍යාත්මක, තාක්ෂණික හා ශිල්පීය ක්‍රියාදාමයක් වන අතර පිරිරක්ෂණය මගින් පුරාවස්තුවක ජීරණයවීම වැළැක්වීමටත් නැවැත්වීමටත්, පමාකිරීමටත් පියවර ගැනීම සිදුවනවාක් මෙන් ම ප්‍රතිසංස්කරණය මගින් විකෘති වූ පුරාකෘති යථාතත්වයට පත්කිරීමට පියවර ගැනීම සිදුවෙයි." ලගමුව, ආරිය., **ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව,** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2006, 310 පිටුව.
6. එම, 310 පිටුව.
7. පුස්කොළ සංරක්ෂණය සඳහා යොදා ගත් පැරණි සංරක්ෂණ ක්‍රමවේදයන්, චම්පා එන්. කේ. අලහකෝන්, **අතිපූජ්‍ය විලපිටියේ ඤාණවංස අනුනායක ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,** සංස්: ගොඩමුන්නේ පඤ්ඤාකිත්ති හිමි ආදිහු, 2007, 307 පිටුව.
8. එම, 308 පිටුව.
9. ලගමුව, ආරිය., 2006, 327 පිටුව.
10. එම, 325 පිටුව.
11. ලගමුව, ආරිය., 2006, 329 පිටුව.
12. රණසිංහ, සඳ ලාලිත්, පුස්කොළ පොත් ලියන පන්සලක හිඳ, **සිළුමිණ,** 18 ජූනි 2000, 9 පිටුව.
13. පුස්කොළ සංරක්ෂණය සඳහා යොදා ගත් පැරණි සංරක්ෂණ ක්‍රමවේදයන්, චම්පා එන්. කේ. අලහකෝන්, **අතිපූජ්‍ය විලපිටියේ**

**ඤාණවංස අනුනායක ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,** සංස්: ගොඩමුන්නේ පඤ්ඤාකිත්ති හිමි ආදිහු, 2007, 316 පිටුව.

14. එම, 317 පිටුව.
15. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, එන්. අලහකෝන්, පුස්කොළ පොත්වලට සිදුවිය හැකි භෞතික හානි හා ඒවාට තුඩුදෙන සාධක, **විකල්ප පුරාවෘත දෙවන කලාපය,** පුරාවිද්‍යා සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 2008-2009 කලාපයේ 1-16 පිටු බලන්න.
16. සෝමදාස, කේ. ඩී., **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය,** ප්‍රථම භාගය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, 1959, VI පිටුව.
17. අස්ගිරි මහා විහාරීය මුල්ලේගම පන්සලේ සහ ගෙඩිගේ විහාරයේ ඇති පුස්කොළ පොත් එකතුව පිළිබඳ පර්යේෂණයක් වයි. කේ. තිස්ස බණ්ඩාර මහතා විසින් සිදු කර ඇත. මේ පිළිබඳ වැඩිදුර කරුණු අධ්‍යයනය කිරීම සඳහා, අතීත ස්මරණ-අස්ගිරි මහා විහාරයීය පුස්කොළ පොත්, වයි. කේ තිස්ස බණ්ඩාර, **සත්සිය වස් සපිරි අස්ගිරි මහා විහාරය,** සංස්: ගොඩගම මංගල හිමි, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, 2012, 167 පිට බලන්න.
18. අතීත ස්මරණ-අස්ගිරි මහා විහාරයීය පුස්කොළ පොත්, වයි. කේ තිස්ස බණ්ඩාර, සත්සිය වස් සපිරි අස්ගිරි මහා විහාරය, සංස්: ගොඩගම මංගල හිමි, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, 2012, 167 පිටුව
19. මෙම ව්‍යාපෘතිය ආචාර්ය දිවුලපැලැස්සේ විමලානන්ද හිමියන් විසින් සිදු කරගෙන යනු ලැබේ.
20. මෙම තොරතුරු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි මහනුවර ශාඛාව මගින් ලබාගන්නා ලදී.
21. සුබසිංහ, රමණී "අටුපොත්දෙණිය පොත්ගුල් රජ මහා විහාරය" **බුදුසරණ,** 26 නොවැම්බර් 2017.

# ලක්දිව පුස්කොළ පොත් පිළිබඳ තොරතුරු මූලාශ්‍රය කිහිපයක හඳුන්වාදීමක්

- වයි. කේ. තිස්ස බණ්ඩාර

**සාරාංශය**

මුද්‍රිත මාධ්‍යයෙන් ලංකාව තුළ පොත් පත් බිහිවීමේ ඉතිහාසය දැනට සියවස් තුනකට ආසන්න ය. ඊට ප්‍රථමයෙහි ලක්දිව ග්‍රන්ථකරණය සිදු වූයේ අත් පිටපත් ලෙසිනි. එම අත් පිටපත් සඳහා ශාකමය අමුද්‍රව්‍ය සහ ලෝහමය අමුද්‍රව්‍ය භාවිතයට ගැනුණි. මෙහි මුලින් දක්වන ලද අමුද්‍රව්‍ය භාවිතයෙන් පුස්කොළ පොත් හා තවත් ද ලේඛන සම්පාදනය විය. මෙකී විඥාපන සම්පත් සම්බන්ධයෙන් ලංකාවට දිගු ඉතිහාසයක් තිබෙයි. ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ බොහෝ පර්යේෂණ සිදුව ඇති අතර ඒවා ආශ්‍රයෙන් විවිධ ප්‍රකාශන පළව ඇති බව විශද ය. එහෙත් තව ද මේ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන සිදුවීම කාලීන අවැසියාවකි. මෙය ජාතික මට්ටමේ වැඩ පිළිවෙලක් තුළින් අවසන් කළ යුතු කාලය උදාවී තිබෙයි. එයට හේතු වන්නේ ලංකාවේ පුස්කොළ පොත් යනු බහු විෂයක තොරතුරු මූලාශ්‍රය සමුදායක් වන බැවිනි. ශ්‍රී ලංකාවේ ජාතික උරුම අතර එන ස්පර්ශිත උරුමයටත් අස්පර්ශිත උරුමයටත් අදාළ පුස්කොළ පොත් එකතුවලට අයත් ඇතැම් පිටපත් අභාවයට යෑම සිදුවෙයි. විවිධ ආයතන සහ විවිධ පර්යේෂකයන් විසින් මේ වනවිට ලංකාවේ පැරණි පුස්කොළ පොත් රැසක් සංස්කරණයට සහ අනුලේඛනයට පත්කරන ලදුව මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පත්කිරීම විශේෂයෙන් සිහිපත් කළ යුතු වන්නේ ය. ඒ නිසා ම අපට බුදුසමය අදාළ ව පෙළ, අටුවා, ටීකා, ටිප්පනි, ගැටපද හා සන්න සහිත අනර්ඝ සාහිත්‍යයක් හිමි ය. පාලි, සංස්කෘත සහ සිංහල සම්භාව්‍ය සාහිත්‍යය අපට උරුමව ඇත්තේ පැරණි පුස්කොළ පොත් මුල් මූලාශ්‍රය වෙතින් බව පැහැදිලි වෙයි. එපමණක් ද නොව පැරණි ඉතිහාසය, සංස්කෘතිය, ජනශ්‍රැති, කලාව, ශිල්පශාස්ත්‍ර, භාෂාශාස්ත්‍ර, ව්‍යාකරණ, ඡන්දස් අලංකාර, පද්‍ය සාහිත්‍යය, ජ්‍යොතිෂ, ගුප්ත ශාස්ත්‍ර මෙන් ම ආයුර්වේද හා දේශීය වෙදකම සහ තව ද විඥාපන රැසක් පුස්කොළ ලේඛන මාධ්‍යයෙන් ලංකාවේ සුරැකිව තිබීම භාග්‍යයකි.

මේවා සුරක්ෂිතව තිබෙන ස්ථාන, ඒවා කුමන විෂයයන්ට අයත් පිටපත් ද, එම පොත්වල අන්තර්ගතය කුමක් ද, කිනම් කාලවකවානුවල කවුරුන් විසින් ලියන ලද ඒවා ද සහ තවත් විස්තර දැනගැනීමට තොරතුරු මූලාශ්‍රය අවශ්‍ය වන්නේ ය. අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂකයින් සඳහා මේ මූලාශ්‍රය බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ ය. එහෙයින් පුස්කොළ පොත් පිළිබඳ තොරතුරු මූලාශ්‍රය සම්පාදන කිරීම අවශ්‍ය දෙයකි. එබඳු සම්පාදන රැසක් ලංකාව හා සම්බන්ධව සිදුව තිබෙයි. ඒවා පුද්ගලිකව මෙන්ම ආයතන වශයෙනුත් දේශීය සහ විදේශීය වශයෙනුත් විවිධ ය. මේවා සියල්ල පිළිබඳව විස්තර කිරීම මෙ බඳු කෙටි ලිපියකින් හෙළි කිරීම අසීරු කරුණකි. ඒ හෙයින් තෝරාගනු ලැබූ නිදසුන් ඇසුරෙන් අදාළ තොරතුරු මූලාශ්‍රයන් පිළිබඳව කෙටි හැඳින්වීමක් මෙයින් ඉදිරිපත් කරනු ලැබෙයි.

**ප්‍රමුඛ පද - ලංකාවේ පුස්කොළ පොත්, පුස්කොළ පොත් සාහිත්‍යය, අකාරාදි, ග්‍රන්ථ නාමාවලි**

## ප්‍රවේශය

ශ්‍රී ලාංකේය පුස්කොළ ලේඛන කලාව සහ එහි ඓතිහාසික පසුබිම විචාර පූර්වකව විමසා බැලීමේ දී මේ ආශ්‍රිත සුවිශේෂ සාහිත්‍යයක් නිර්මාණය වී ඇති ආකාරය පැනෙයි. මේ ක්ෂේත්‍රයේ අධ්‍යයන හා පර්යේෂණයෙහි නිරතවන විද්‍යාර්ථයින් සඳහා අත්‍යවශ්‍ය වූ දෙයක් වන්නේ එම සාහිත්‍යය පිළිබඳ අවබෝධය ලබා තිබීම ය. එකී සාහිත්‍යය ප්‍රධානතම මූලාශ්‍රය වශයෙන් භාවිත කිරීමෙන් තම අපේක්ෂිත පර්යේෂණයෙන් ප්‍රතිඵල ලද හැකිවෙයි. තොරතුරු මූලාශ්‍ර (Information Sources) බහුවිධ ය. "තොරතුරු යන වචනය තුළ විවිධ සංකල්ප ගැබ් වී ඇත. එය නිවැරදිව විග්‍රහ කිරීම අතිශයින් දුෂ්කරය. තොරතුරු හා දැනුම යන දෙක ම එක දෙයක් ද? කරුණු, දත්ත, තොරතුරු, දැනුම, අවබෝධය වැනි වචනවල අර්ථයන් අප වෙන්කොට හඳුනා ගන්නේ කෙසේද? තොරතුරු යන පදය ගුවන් විදුලි මාර්ග ඔස්සේ එන සන්නිවේදනයන් ලෙස හඳුනා ගැනෙයි. තවත් සමහරු එය වාර්තා ගත කරන ලද කරුණු (Recorded Facts) ලෙස හඳුන්වති. මනුෂ්‍ය සිත තුළ ගැබ් වී ඇති අත්දැකීම් ලෙස සමහරු එය හඳුන්වති. තොරතුරු යන්න නිර්වචනය කිරීමේ දී එය පහත සඳහන් අයුරින් දැක්විය හැකිය.

සකස් කරන ලද දත්ත (Processed Data) අපට තොරතුරු වශයෙන් කෙටියෙන් නිර්වචනය කළ හැකිය. මෙම සකස් කිරීම යනු දත්ත සංක්‍රමණය, දත්ත තේරීම, දත්ත සංවිධානය හෝ දත්ත විශ්ලේෂණය විය හැකියි. දත්ත විශ්ලේෂණය හෝ සාරාංශකරණය තුළින් අර්ථවත් ස්වරූපයෙන් ලබාගැනීම තොරතුරු වශයෙන් හැඳින්වීමට පුළුවන."[1] වර්තමාන ලොව තොරතුරු තාක්ෂණය අතින් ලබාගෙන ඇත්තා වූ දියුණුවේ ස්වභාවය අනුව ඒ ඒ ක්ෂේත්‍ර තුළ විවිධ වූ සංවර්ධනාත්මක තත්ත්ව දැකිය හැකිය. "තොරතුරු ආකාර පහකි. ඒවා නම් : 1. තථ්‍ය (Facts) 2. සංකල්පීය (Concepts) 3. පටිපාටිමය (Procedures) 4. ක්‍රියාවිධි (Process) 5. සිද්ධාන්තමය (Principles)"[2] යනුයි.

මෙම කරුණු තව ද විස්තර කිරීමේ දී එහි අංක එකට අයත් එනම් තථ්‍ය යන්නට විස්තර මෙසේ සැපයේ. " කිසියම් ද්‍රව්‍යක්, පුද්ගලයෙක්, ප්‍රදේශයක් හෝ දිනයක් හඳුන්වන ඒකීය තොරතුරු කොටසක් තථ්‍ය තොරතුරක් ලෙස හඳුන්වමු" යනු යි.[3]

තොරතුරු සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳව වර්තමානයේ බොහෝ සෙයින් ම අසන්නට කියවන්නට ලැබෙනුයේ විද්‍යුත් මාධ්‍යය සම්බන්ධයෙනි. එමෙන් ම නූතනයේ දී විවිධ මෙවලම් භාවිතයෙන් විවිධ තොරතුරු විවිධ උපක්‍රම අනුව භාවිත කෙරෙන සෙයක් දක්නට ඇත.

මෙහි ඉහත දක්වනු ලැබ ඇති ක්‍රම පහකින් යුත් තොරතුරු ආකාර අතර මුලින් ම දැක්වෙන තථ්‍ය (Facts) යටතේ කිසියම් ද්‍රව්‍යයක් යන්න තුළට පුස්තකාල ද්‍රව්‍ය අන්තර්ග්‍රහණය කළහැකි ය. පුස්තකාල ද්‍රව්‍ය යනු රාජ්‍ය චක්‍රලේඛ අනුසාරව පොත්, සඟරා ඇතුළු මුද්‍රිත මාධ්‍යයන් ද තොරතුරු අඩංගු විද්‍යුත් මාධ්‍යය ද වෙයි.[4] ඒ අනුව පුස්තකාලද්‍රව්‍ය අතරට අයත් පොත් අතරේ අත්පිටපත් ලෙසින් සම්පාදනව ඇති පුස්කොළ පොත් ද අයත් වන්නේ ය. මේ නයින් බලන කල ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් කොපමණද ඒවා තිබෙන්නේ කුමන ස්ථානවල ද යනු තවම අවසන් නිගමනයට පැමිණ නැති තත්ත්වයකි.

"මෙරට හා විදේශයන් හි පුද්ගලයන් සතුව ඇත්තා වූ ද, විවිධ ආයතනයන්හි තැම්පත් කොටඇත්තා වූ ද, සිංහල පුස්කොළ පොත් සංඛ්‍යාව හැත්තෑපන්දහසක් පමණ ඉක්මවන බව කිවහැකිය."[5]

"ශ්‍රී ලංකාවේ දැනට හමු වී ඇති පැරණි ම පුස්කොළ පොත ක්‍රි. ව 13 වැනි සියවසට අයත් චුල්ලවග්ගය බවට සාක්ෂි ඇත."[6] ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ තොරතුරු මූලාශ්‍රය ගණනාවක් තිබෙයි. පර්යේෂකයින්ගේ ප්‍රයෝජන පිණිස දැනට සම්පාදනය වී ඇති ඒවා භාවිත කිරීමත් මෙතෙක් සංග්‍රහ වී නොමැති තොරතුරු සංග්‍රහ කිරීමත් කාලීන අවශ්‍යතාවක් බව හඳුන්වාදිය හැකිය. මෙරට පුස්කොළ පොත් පිළිබඳ තොරතුරු මූලාශ්‍රයන් සම්පාදනයේ ආරම්භය මීට වසර 150 ක් පමණ ඉහත සිට පැවතෙන බවට සාක්ෂි තිබෙයි.

මෙම වාර්තාකරණවල ඓතිහාසික පසුබිම සැකෙවින් මෙසේ දක්වමු. " ... මේ අනුව එසේ එක් රැස්කර ගන්නා ලද සියලු තොරතුරු ඇතුළත් කොට ලක්දිව පන්සල් හා පොත්ගුල් ආශ්‍රයෙහි ඇති අත්පිටපත් සහ ග්‍රන්ථවල නාමලේඛනයක් පිළියෙළ කිරීමේ කාර්යය රජය බාරදුන්නේ ව්‍යවස්ථාදයක සභාවේ මන්ත්‍රීවරයෙකු සහ නීතිඥයකු වු ජේම්ස් ද අල්විස් පඬිතුමාට ය. එකම ග්‍රන්ථයේ පිටපත් කිහිපයක් තිබෙන බවද දුටු අල්විස් පඬිවරයා, ඒවාට වේයන්ගෙන් වන හානිය ද සලකා රජයේ වාර්තාගාරයේ වෙනම පුස්තකාලයක් මෙම අත්පිටපත් වෙනුවෙන් පිළියෙල කරන්නේ නම් යහපතැයි රජයට යෝජනාවක් කළේය. රජයේ ඒජන්තවරුන් මගින් අත්පිටපත් එකට වැඩි තැන්වලින් මිලයට ගෙන හෝ ඒවා පිටපත් කරගන්නට ඇති පුළුවන්කම ද පෙන්වා දුන්නේ ය. මෙම යෝජනාව රජය විසින් පිළිගන්නා ලද අතර, ඒ සඳහා ව්‍යවස්ථාදයක මන්ත්‍රී මණ්ඩලය විසින් මුදල් ද වෙන්කරන ලද්දේ ය. 1870 ජුලි 27වැනි දින කොළඹ කච්චේරියේ දී පෙරදිග පුස්තකාල කමිටුවක් පිහිටුවගන්නා ලදී. එම කමිටුවට සභාපති ලෙස ආර්. එෆ්. මෝර්ගන් ද, ලේකම් ලෙස ජේම්ස් ද අල්විස් ද පත්වූහ. ඉතිරි සාමාජිකයන් වූයේ සී. පී. ලොයාර්ඩ්, ලුවී ද සොයිසා සහ අන්දිරිස් ද සිල්වාත් ය. එහි කළමනාකරණයට අදාළ නීති රීති ගැසට් මගින් ප්‍රකාශයට පත්විය. සබරගමුව, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලින් අත්පිටපත් ලබාගැනීම සඳහා රජයේ දිසාපතිවරුන්

යටතේ අනුකම්ටු පිහිටුවිණි.... වශයෙනි. 1871 දී ජේම්ස් ද අල්විස් විසින් පැරණි සාහිත්‍යයික අත්පිටපත් නාමාවලි නිමාකරන ලදී. එතෙක් බෞද්ධ භික්ෂූන් සහ දේශීය වෛද්‍යවරුන් ස්වල්පයකගේ ඇස් ගැසී තිබූ සමහර පාලි සහ සිංහල පොත් ප්‍රථමවරට මේ නිසා ප්‍රසිද්ධියට පත්විය. මේ නිසා පන්සල්වල ඇති අත්පිටපත් ගැන ඉතා ඉක්මන් පරීක්ෂණයක් කොට වාර්තා කිරීමේ අවශ්‍යතාව ඉතා හදිසි එකක් බවට පෙනී ගියේය. රජය විසින් මහමුදලි ලුවී ද සොයිසා ඒ කාර්යය සාර්ථක කරගන්නට පත්කරන ලදී. ලුවී ද සොයිසා උපතින් ක්‍රිස්තු භක්තිකයෙකු වුව ද වයඹ, දකුණු සහ මධ්‍යම පළාතේ පන්සල්වලට ගොස් ඒවාගේ පොත්ගුල් සහ අල්මාරි, පෙට්ටගම් ආදිය සොයා බලා තිබූ ග්‍රන්ථ ගැන වාර්තාවක් සකස් කළේය. මාතර පළාතේ පමණක් පන්සල්වලට ඇතුලුවුව ද ඒවාගේ ආරක්ෂකයන්ගේ ඊර්ෂ්‍යාව සහ නොදැනුම නිසා ඔහුට ඒ පළාතෙන් වැඩි සහයක් ලැබුනේ නැත. එම වාර්තාව 1875 දී මුද්‍රිතයි."[7]

මෙ බඳු පසුබිමකින් ආරම්භ වූ ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ වාර්තාකරණය විවිධ ස්වරූපවල ප්‍රකාශන මගින් බොහෝ ප්‍රමාණයක් මේ වනවිට ප්‍රකාශයට පත්ව තිබෙයි. මේවායින් සැලකිය යුතු ප්‍රමාණයක විස්තර ඇතුළත් ප්‍රකාශනයක් ද පළව තිබෙයි.[8]

එම ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ මේ ක්ෂේත්‍රයේ ආරම්භක පසුබිමේ සිට ක්‍රි. ව 2007 ජුලි මස දක්වා ප්‍රකාශනයට පත්ව ඇති තොරතුරු මුලාශ්‍රය රැසක් හෙළිදරවු කිරීම කාලෝචිත ක්‍රියාවකි. මේ සඳහා දායක වූ සැවොම පැසසුමට ලක් කරමු. පුස්කොළ පොත් ක්ෂේත්‍රයේ සාහිත්‍යය ගවේෂණය කරන අය සඳහා එය අගනා යතුරකි. මෙහි නවතම සංස්කරණයක් සිදු කළ හොත් එයට හසුනොවී ඇති ඇතැම් තොරතුරු සහ 2007 වර්ෂයෙන් පසුව මේ ක්ෂේත්‍රයේ පළව ඇති තව ද තොරතුරු මූලාශ්‍රයයන් එයට එකතුවිය හැකි ය.

එකී ප්‍රකාශනයේ අන්තර්ගත තොරතුරු මූලාශ්‍රය යම් ප්‍රමාණයක් මෙම ලිපියේ අන්තර්ගත කරනුයේ අදාළ සම්පාදකවරුන් වෙත අපගේ ස්තුති පිරිනැමීමත් සමග බව කරුණාවෙන් සැලකුව මැනවි. ඒවාට අමතරව තව ද තොරතුරු මූලාශ්‍රය කීපයක් උක්ත ප්‍රස්තුත මැය

යටතේ විස්තර සහ නිදසුන් වශයෙන් දැක්වීමට අපේක්ෂා කෙරෙයි. පුස්කොළ පොත් ආශ්‍රිත අධ්‍යයනයේ දී තොරතුරු මූලාශ්‍රය සමුදයක් වශයෙන් පවතින ලේඛන ප්‍රමාණයෙන් සහ වර්ගවලින් විවිධය. ඇතැම් ඒවා මුද්‍රණයෙන් පළව තිබෙයි. තවත් ප්‍රමාණයක් යතුරු ලියන මෙන් ම පරිගණක යතුරු ලියන මගින් ද සකසා තිබෙයි. මේවාට අමතරව අතින් ලියූ පිටපත් වශයෙන් ද යම් ප්‍රමාණයක් තිබිය හැකිය. මේ කුමන මාධ්‍යයකින් වුව ද මේවා තොරතුරු මූලාශ්‍රයයන් වන්නේ ය. නිදසුන් වශයෙන් ඒවා කිහිපයක් මතු දැක්වෙන පරිදි වර්ග කළ හැකිය.

| | |
|---|---|
| ග්‍රන්ථනාමාවලි | - Bibliography |
| සවිස්තරාත්මක නාමාවලි | - Catalogues |
| ලැයිස්තු | - List |
| වාර්තා | - Reports |
| වෙනත් ලේඛන | - Other Documents |
| වාරසඟරා ලිපි | - Periodical Articles |

## ග්‍රන්ථ නාමාවලි

**ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය ප්‍රථම භාගය.[9]**

මෙම කොටසට අයත් හැඳින්වීම තුළ එහි අරමුණ දක්වා තිබෙයි. එයට අමතරව 1885 වර්ෂයේ දී ලුවිස් ද සොයිසා මුදලිවරයාගේ පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලිය පිළිබඳව සහ 1938 ඩබ්. ඒ. ද සිල්වා මහතාගේ කොළඹ කෞතුකාගාර පුස්තකාලයට අදාළ පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලිය පිළිබඳව නාමතන්ත්‍රිකව සඳහන් කර තිබෙයි. එහි ම මෙම කොටසට විස්තර ඇතුළත් වූ පුස්කොළ පොත් ලැයිස්තු ලබාගත් ආකාරය ද ලැබුණු ලැයිස්තු ගණන ද පුස්කොළ පොත් ගණන ද සඳහන් වෙයි. ඒ පහත දැක්වෙන පරිදිය.

| **පළාත** | **ලැබුණු ලැයිස්තු ගණන** | **පුස්කොළ පොත ගණන** |
|---|---|---|
| බස්නාහිර | 173 | 5,341 |
| මධ්‍යම | 127 | 5,345 |

| | | | |
|---|---|---|---|
| දකුණ | 431 | | 20,306 |
| වයඹ | 55 | | 1,369 |
| උතුරුමැද | 15 | | 691 |
| ඌව | 35 | | 1,500 |
| සබරගමුව | 77 | | 1,777 |
| **ලැයිස්තුව** | **913** | **පිටපත්** | **44,392** |

ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳව අධ්‍යයනයේ නිරතවන අය සඳහා මෙම ග්‍රන්ථය ඉතා ප්‍රයෝජනවත් මූලාශ්‍රයයක් වන්නේ ය. එහි ලංකාවේ විහාරස්ථාන නවසිය දහතුනකින් එවකට සපයනු ලැබ ඇති පුස්කොළ පොත් පිටපත් 44,329ක ග්‍රන්ථනාම පෙළගස්වා තිබෙයි. සිංහල අකාරාදි ක්‍රමයට නාමාවලිගතකර ඇති එම පුස්කොළ පොත් එවකට තැන්පත් ව තිබුණු ස්ථාන හඳුන්වා ඇත. එම ලේඛනයේ ප්‍රථමයෙන් ම ඇත්තේ අකාරාදි නිඝණ්ඩුව (වෛද්‍ය), වෛද්‍ය අකාරාදිය යන්න යි. ඒ සමගම 234, 331, 704 යන අංක තුන ද සටහන් ව පවතියි. එකී අංකයන්ගෙන් කියැවෙන්නේ එම පිටපත තිබෙන විහාරස්ථානය යි. ඒ අනුව 234 යටතේ බෝධිරුක්ඛාරාම විහාරස්ථානය - කොස්සින්න, කැටවල, ලෙවුලෙ යනුවෙන් ද අංක 331 යටතේ ශ්‍රී රාහුලාරාම මහාවිහාරය - පාතේගම, වැලිතර, බළපිටිය යනුවෙන් ද අංක 704 යටතේ සද්ධර්මෝදය පිරිවෙන් විහාරය - ගොඩවෙල, නිහිළුව ලෙස විහාරස්ථාන නාමලේඛනය යටතේ දැනගත හැකිය. මෙහි අන්තර්ගත විහාරස්ථාන 913 ඒ ඒ දිස්ත්‍රික්ක වශයෙන් ද බෙදා වෙන්කර තිබෙයි. ඒ අනුව පුස්කොළ පිටපතක් සොයන පර්යේෂකයෙකුට එය තව ද පහසු කරුණක් වන්නේ ය. දැනට වසර හැටකට ( 60 ) පෙර සංග්‍රහ කරනු ලැබූ මෙම ග්‍රන්ථ නාමාවලියට අයත් පුස්කොළ පිටපත් ඒ ඒ විහාරස්ථානවල එවකට පැවතිය ද ඇතැම් ඒවා වර්තමානයේ තිබෙයි ද යන්න විමසිය යුතු කරුණකි. මෙම ලියුම්කරු පුස්කොළ පොත් පරික්ෂාවේ යෙදෙන විට ඇතැම් තැනක එසේ වාර්තා වූ පුස්කොළ පිටපත් නොතිබූ බව අනාවරණ විය.

**පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලිය ද්වීතීය භාගය**

ඉහත ග්‍රන්ථයේ ද්වීතීයභාගය ද කේ. ඩී. සෝමදාස මහතා විසින් සම්පාදනය කරන ලදුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින්

පළකරන ලදී. එහි ලංකාවේ විහාරස්ථාන හයසිය හැත්තෑසතරකින් (674) ලබාගත් පුස්කොළ පොත් පිටපත් දහස් ගණනක ග්‍රන්ථනාම අන්තර්ගත වෙයි. පළමු කොටසේ සැලැස්මට තරමක් වෙනස් ආකාරයකින් සම්පාදනය වී ඇති ද්විතීය භාගයේ විහාරස්ථාන දිස්ත්‍රික් වශයෙන් වෙන්කර නොමැත. ග්‍රන්ථනාම අකාරාදි ක්‍රමයෙන් පෙළගස්වා තිබෙයි. එහි ද අකාරාදිය (සිංහල), සිංහල අකාරාදිය, අකාරාදිනිඝණ්ඩුව, සිංහලනිඝණ්ඩුව, එළු අකාරාදිය යනුවෙන් ශීර්ෂ නාම කිහිපයකට දැක්වෙයි. විහාරස්ථාන එකොළහකට අයත් අංක ද මේ සමග දැක්වෙයි. ඒවා අනුව පිටපත් සොයන අයෙකුට අදාළ ස්ථානය වෙත ප්‍රවේශ විය හැකිය. මෙහි එක් නිදසුනක් මෙසේ දක්වමු. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ වෛද්‍යවරයාගේ අත්වෙදපොත - 669 යන්න යි. මෙම අංකයෙන් නියෝජන වන්නේ ශාස්ත්‍රෝදය පිරිවෙන - මාරපන, සබරගමුව පළාත ලෙස ය. මේ දක්වන ලද ද්විතීයභාග යෙහි අවසාන විහාරස්ථානය වන්නේ අස්ගිරි විහාර මැදපන්සල ය. එයට යෙදී ඇති අංකය 674 වන්නේ ය. මෙකී විහාරස්ථානයේ තිබී එවකට ලේඛනගතව ඇති ශාසනාභිවෘද්ධි කතිකාව පුස්කොළ පිටපත දැන් එහි නැත. එමෙන්ම එම විහාරයේ එවකට තිබී පුස්කොළ පොත් ග්‍රන්ථනාමාවලිය ද්විතීයභාගයේ සෝමදාස මහතා වාර්තාකර ඇති අස්ගිරි උපත නැමැති පුස්කොළ පිටපත ද දැනට එහි නැත. එකී පිටපත අනු ලේඛනයෙන් අනතුරුව මුද්‍රණයෙන් පළව තිබෙයි.[10] පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ ස්වාමින්ද්‍රයන් වහන්සේට (වර්තමාන මහාචාර්ය) එම පිටපත ලැබුණු ආකාරය එහි සංඥාපනයේ සඳහන් වෙයි. මෙ බඳු සාධක අනුව එවකට වාර්තා වූ පුස්කොළ පොත් පිටපත් සියල්ල ම ඒ ඒ විහාරස්ථාන සතුව තිබෙයි ද යනු නිශ්චිත නැත. එහෙත් වැඩි ප්‍රමාණයක් තිබෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

## පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලිය තෘතීය භාගය

කේ. ඩී. සෝමදාස මහතා විසින් සම්පාදනය කරන ලදුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද මෙම කොටස සුවිශේෂ ග්‍රන්ථ නාමාවලියක් වන්නේ ය. එයට ප්‍රධාන හේතුව වන්නේ ලංකාවට අයත් එහෙත් දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරය තුළ තිබෙන පුස්කොළ පොත් පිටපත් හාරදහසක පමණ ග්‍රන්ථනාම ලේඛනයක් වීමය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ

ලාංකේය පුස්කොළ පොත් නාමාවලිය"නමින් වූ මෙම කොටස තුළ පුස්කොළ පොත් ග්‍රන්ථනාම අකාරාදි පිළිවෙළට යොදා තිබෙයි. එම පිටපතේ භාෂාව, පත්තිරු ප්‍රමාණය සහ අදාළ පිටපතට අයත් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ අංකය ද මෙහි ඇතුළත් ය. පුස්කොළ පොත් ආශ්‍රිත අදාළ විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ කරන අයට මේ ග්‍රන්ථ නාමාවලිය ප්‍රයෝජනවත් වන්නේ ය. එහි අන්තර්ගත ග්‍රන්ථනාම විමසීමේ දී ලංකාවේ පුස්කොළ පොත් කෙතෙක් ලියැවී ඇත්දැයි දැනගත හැකිය. කේ. ඩී. සෝමදාස මහතා සඳහන් කරන පරිදි බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ලාංකේය පුස්කොළ පොත්වලින් පොතක ඡායා පිටපතක් ලබාගත හැකි බවය. මේ සඳහා උපදෙස් එහි සඳහන් වෙයි. මෙම තොරතුරු මූලාශ්‍රය තුළින් ලාංකේය පැරණි පුස්කොළ පොත් බොහෝ ප්‍රමාණයක් පැවති බව දැනගත හැකි ය.

## නාමාවලි

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුස්කොළ පොත් නාමාවලිය. කැලණිය විශ්වවිද්‍යාලය, 1986 වර්ෂයේ පුස්තකාල හා විඥාපන විද්‍යා විශේෂවේදී උපාධි අපේක්ෂක පී. එම්. ආර්. පද්මසිරි මයා විසින් රචනා කරන ලද නිබන්ධයයි. උක්ත විද්‍යායතනය සතු පුස්කොළ පොත් 300ක් සඳහා වූ ශීර්ෂ නාම තව ද විස්තර අඩංගු සහිත මෙය යතුරු ලේඛන පිටපතකි. පිටු 79කි. ජාතික පුස්තකාලයේ මෙහි පිටපතක් තිබෙන බව වාර්තාවෙයි.[11]

**මයික්‍රොෆිල්ම් කරන ලද පුස්කොළ පොත්, අත් පොත් සහ මුද්‍රිත පොත් නාමාවලිය.**

රාජගිරිය දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සතු දේශීය වෙදකමට අයත් පුස්කොළ පොත් 70 ක් පිළිබඳ විස්තර මෙහි අන්තර්ගත වෙයි.[12] 1999 වර්ෂයේ දී යතුරු ලියනය කරන ලද අතර එහි සූක්ෂම ඡායා පිටපතට පිටු 16ක් අයත් වෙයි. එම පිටපත එකී විද්‍යායතන පුස්තකාලයේ තිබෙයි.

### ආයුර්වේද පුස්කොළ පොත් ඒකාබද්ධ නාමාවලිය

ජයසිරි ලංකාගේ මහත්මා විසින් සම්පාදන කරන ලද මෙහි වෙදකමට අයත් පුස්කොළ පොත් 760ක් පිළිබඳ ශීර්ෂ නාම සහ තව ද විස්තර ඇතුළත් වෙයි.[13] මේ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතන පුස්තකාලය, බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ පුස්තකාලය සහ ජාතික කෞතුකාගාර පුස්තකාලයීය පුස්කොළ පොත්වලට අයත් දේශීය පුස්කොළ වෙද පොත් භාවිත කර තිබෙයි. 1987 වර්ෂයේ දී සම්පාදිත මෙයට යතුරු ලේඛන පිටු 327ක් අයත් වෙයි. මෙහි පිටපත කොළඹ ස්වභාවික සම්පත් හා විද්‍යා අධිකාරිය සතුව පවතියි.

### ලැයිස්තු

පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලිවලට අමතරව පොත් ලැයිස්තු වර්ගයක් විවිධ ස්වරූයෙන් තිබෙයි. ඉන් කීපයක් පහත පරිදි වෙයි.

**පුස්කොළ පොත් නාමාවලිය කොළඹ කෞතුකාගාරය.[14]** -
අත් අකුරින් ලියන ලද පිටු දෙකකින් සමන්විත මෙම ලැයිස්තුවේ එම කෞතුකාගාරයට අයත් පුස්කොළ පොත් 70 ක් ගැන විස්තර අඩංගු වෙයි. 2005 වසරේ දී සම්පාදිත මේ ලැයිස්තුව එම දෙපාර්තමෙන්තුව සතු වෙයි.

**පුස්කොළ පොත් නාමාවලිය කොළඹ ජාතික කෞතුකාගාරය කොළඹ.[15]**-
යතුරු ලියන පිටු 28ක් වූ මෙම ලැයිස්තුවට එම පුස්තකාලයට අයත් පුස්කොළ පොත් 904ක නම් ඇතුළත් වෙයි. ලැයිස්තුව එම පුස්තකාලය සතු ය.

**පුස්කොළ පොත් නාමාවලිය වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය ගම්පහ.[16]** -
අත් අත් අකුරින් ලියන ලද ලැයිස්තුව එම ආයතනයට අයත් දේශීය වෙදකමට අදාළ පුස්කොළ පොත් 50ක නම් අයත් ය. එකී ආයතනය සතුව එම ලේඛනය තිබෙයි.

**පුස්කොළ පොත් පිළිබඳ නාමාවලිය බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය මහරගම.**[17] -
දේශීය වෙදකමට අදාළ එම ආයතනය සතු පුස්කොළ වෙදපොත් 592ක මෙම නම් ලැයිස්තුව යතුරු ලේඛන කරන ලද්දකි. 2003 වසරේ දි සකසන ලද මෙය එම ආයතනයේ තිබෙයි.

**පුස්කොළ පොත් ලැයිස්තුව කැලණිය රජමහා විහාරය කැලණිය.**[18] -
මෙය එම විහාරස්ථානට අයත් පුස්කොළ පොත් 40ක නම් අත් අකුරින් ලියන ලද ලේඛනයකි. 2004 වසරේ දී ලියා ඇති මෙම ලේඛනය කැලණිය රජමහ විහාරය සතුය.

**පුස්කොළ පොත් ලැයිස්තුව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය කොළඹ.**[19] -
යතුරු ලේඛන කරන ලද මෙම ලේඛනයට එම ආයතනයට අයත් පුස්කොළ පොත් 22 ක නම් ඇතුළත්ය. 2005 වර්ෂයට අයත් මෙය යතුරු ලියනය කළ එකකි.

**මහනුවර අස්ගිරිය මහාවිහාරයීය පුස්කොළ පොත් : 1.**[20] -
වර්තමාන ලේඛක විසින් සම්පාදනය කරනු ලදුව පළකොට ඇති එකී පුස්කොළ පොත් නාමලේඛනයට අයත් වන්නේ අස්ගිරිය මහාවිහාරයට අයත් මුල්ලේගම පන්සලේ පුස්කොළ පොත් එකතුවයි. දැනට පලිපාන චන්දනන්ද බෞද්ධ විද්‍යාලයීය පුස්තකාලයේ තැන්පත්ව ඇති එකී පුස්කොළ පොත් 2007 වර්ෂයේ දී මේ පර්යේෂක විසින් ලේඛනගත කොට අංක යොදා පුස්තකාලයේ තැන්පත් කර තිබෙයි. අන්තර්ගත ග්‍රන්ථනාම 98 කි. මේ සඳහා එම ස්ථානයේ අධිපති ආචාර්ය ගොඩගම මංගල හිමි විශේෂ අනුග්‍රහයක් ලබාදුන් බව ස්තුති පූර්වකව සිහිපත් කරමි.

**අස්ගිරිය මහාවිහාරයීය පුස්කොළ පොත් එකතු.**[21] -
වර්තමාන ලේඛක විසින් සම්පාදන කරන ලද මෙම නිබන්ධයෙහි අස්ගිරිය මහාවිහාරයේ ස්ථාන කීපයකට අයත් පුස්කොළ පොත් ග්‍රන්ථනාම අකාරාදි ක්‍රමයටත් එක් කොටසක් මිශ්‍ර නාම ලෙසටත් පළව තිබෙයි. ඒ අතර මුල්ලේගම පන්සලට අයත් පුස්කොළ පොත් සහ ආදාහන මළුව විහාරයට අයත් පුස්කොළ පොත් 226ක ග්‍රන්ථ

නාම අකාරාදි ක්‍රමයට දක්වා තිබෙයි. ස්ථාන දෙකක ග්‍රන්ථ එකම ලැයිස්තුවක ඇතත් ඒ ඒ විහාරවල නමට යෙදී ඇති මුල් අකුර අදාළ ග්‍රන්ථයට හිමි අංකයට ඉදිරියෙන් දක්වා තිබෙයි.

නිදසුන් : අඞ්ගුත්තරනිකාය - (මු.04)
අඞ්ගුලිමාල පදාර්ථ - (ආ.121)

එම සංකේත අනුව මුල්ලේගම පන්සලට අයත් එහි තිබෙන පිටපතත් ආදාහන මළුව විහාරයට අයත් එම පිටපතත් හැඳින්වෙයි. ඉලක්කමෙන් දැක්වෙනුයේ එම විහාරයට අයත් පුස්කොළ පොතේ අංකයයි.

මෙම ලේඛනයේ අන්තර්ගත කළ තවත් පුස්කොළ පොත් නාමාවලියක් වන්නේ අස්ගිරි විජයසුන්දරාරාමයේ පුස්කොළ පොත් සම්බන්ධවයි. එම නාමලේඛනය සැකසූ ආකාරය පිළිබඳ විස්තර අදාළ ලිපිය තුළින් දක්වා ඇත. ඒ අනුව එකී විහාරස්ථානයට අයත් පුස්කොළ පොත් 325ක ලැයිස්තුවක් අකාරාදි ක්‍රමයට එහි දැක්වෙයි. ඒවාට අමතරව මෙම ලිපිය මගින් අස්ගිරිය මහාවිහාරයේ තවත් පන්සල් තුනක ඇති පුස්කොළ පොත් ග්‍රන්ථනාම දැක්වෙයි. ඒවා උපුටාගෙන ඇත්තේ ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය පළමු සහ දෙවන කාණ්ඩය (1959. සෝමදාස සංස්කරණය) යන මුද්‍රිත කෘතියේ එන අංක අනුසාරයෙන් සකසාගත් පන්සල් තුනකි. ඒ අනුව අස්ගිරියේ මැද පන්සල, වැල්ලව පන්සල සහ අස්ගිරිය මහාවිහාරය යන නම්වලින් දැක්වෙන ස්ථානවල තිබෙන පුස්කොළ පොත් ගැනය. මෙයින් අස්ගිරිය මහාවිහාරය යනුවෙන් අදහස් කරනුයේ කුමන පන්සල ද යන්න නිශ්චිත නැත. ඇතැම් විට එය එම විහාරස්ථානයේ පෝයගෙය වියහැකි ය. අකාරාදි ක්‍රමයෙන් තොරව ඇති මිශ්‍ර නාම ලේඛනයක් වශයෙන් එය ඉදිරිපත් කර ඇත.

**විදේශීය රටක ඇති ලාංකේය පුස්කොළ වෙද පොත් කීපයක්.**[22] - වර්තමාන ලේඛක විසින් සම්පාදනය කරන ලද තවත් ලේඛනයක් වූ මෙම ලිපියෙන් විස්තර වන්නේ එංගලන්තයේ පිහිටුවා ඇති වෛද්‍ය ඉතිහාසය සම්බන්ධ ආයතනයේ (වෙල්කම්) පුස්තකාලය සතුව තිබෙන ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් 663 ක් අතුරින් පිටපත් අසූවක (80) පුස්කොළ වෙද පොත් අකාරාදියකි.

තව ද ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳව ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් ලියා පළකර තිබෙන ග්‍රන්ථනාමාවලි (Bibliographies) කීපයක් වාර්තා වන්නේ ය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ වාර්තා අනුව දේශීය සහ විදේශීයව පවතින පුස්කොළ එකතු ගණනාවක ලැස්තු ඉන් හෙළිදරවු වෙයි. එය පරිශීලන කිරීමෙන් තව ද තොරතුරු දැනගත හැකි ය.

## සවිස්තරාත්මක ග්‍රන්ථනාමාවලි (Catalogue)

පුස්කොළ පොත් අධ්‍යයන සඳහා පර්යේෂකයින්ට බෙහෙවින් වැදගත්වන තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් උක්ත නාමාවලි විශේෂය ද හඳුන්වාදිය හැකි ය. මේවා ග්‍රන්ථනාමාවලිවලට වඩා වෙනස් ය. ලංකාවේ පුස්තකාල කීපයක තිබෙන සහ ලංකාවට අයත් එහෙත් විදේශීය පුස්තකාල කීපයක ද ඇති පුස්කොළ පොත් සැලකිය යුතු ප්‍රමාණයක් අළලා මේ කෘති පළව තිබෙයි. ඒවා සම්බන්ධයෙන් උදාහරණ මතු දැක්වෙයි.

### අස්ගිරි මහවිහාරයීය පුස්කොළ පොත් එකතු පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථනාමාවලිය[23]

මෙය වර්තමාන ලියුම්කරු විසින් සිය පුස්තකාල සහ විඥාපනවිද්‍යාව පිළිබඳ සමාජයීයවිද්‍යා විද්‍යාපති පශ්චාත් උපාධිය සඳහා 2007 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට ඉදිරිපත් කරන ලද නිබන්ධයයි. පරිගණක යතුරුලියන අනුසාර නිබන්ධය පිටු 609ක් සහිත වෙයි. ලේඛන ඉතිහාසය, පුස්කොළ පොත් ලේඛන කලාවේ ශිල්පක්‍රම, අස්ගිරි මහාවිහාරයීය ඉතිහාසය යන ශීර්ෂවලට සැකෙවින් විස්තර මෙහි දැක්වෙයි. ඊට අමතරව උක්ත මාතෘකාව යටතේ එහි විහාරස්ථාන දෙකක පුස්කොළ පොත් 223 ක ග්‍රන්ථ විස්තර අකාරාදි ක්‍රමයට දැක්වෙයි. මේ සඳහා තෝරාගනු ලැබූයේ එහි මුල්ලේගම පන්සලේ සහ ආදාහනමලුව ගෙඩිගේ විහාරයේ පුස්කොළ පොත් එකතු දෙකය. දුර්ලභ ගණයේ පුස්කොළ පොත් මෙම විහාර දෙකෙහි තිබෙන බව එම නිබන්ධය පරිශීලනය කිරීමෙන් දැනගත හැකි ය. බලන්න, වයි.

කේ. තිස්ස බණ්ඩාර ( 2007 ) අස්ගිරි මහාවිහාරයීය පුස්කොළ පොත් පිළිබඳ ඓතිහාසික ග්‍රන්ථවිද්‍යාත්මක අධ්‍යයනයක් යන නිබන්ධය. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය. කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.

Catalogue of the HughNevill collection of Sinhalesemanuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1987.- Vol. 1 .- xi, 439p.[24]

පුස්කොළ පොත් හා සම්බන්ධ විස්තරාත්මක ග්‍රන්ථනාමාවලි (Catalogue) අතරින් උක්ත කෘතිය සහ එයට අදාළ සෙසු වෙලුම් හය ශ්‍රී ලාංකේය පුස්කොළ පොත් පිළිබඳ බොහෝ විස්තර අඩංගු තොරතුරු මූලාශ්‍රයයක් වන්නේ ය. අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂකයින්ගේ විශේෂ අවධානය යොමුව තිබෙන මෙම වෙලුම් හතෙන් විස්තර කෙරෙන පුස්කොළ පොත් හාරදහක් පමණ ස්ථානගතව පවතිනුයේ බ්‍රිතාන්‍යයේ ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ය. මෙයින් වැඩි ම ප්‍රමාණයක් අයත් වනුයේ හ්‍යු නෙවිල් එකතුවට ය. මේවා ආශ්‍රයෙන් කේ.ඩී. සෝමදාස මහතා විසින් සම්පාදන කරන ලද උක්ත කොටසෙහි සිංහල හා පාලි භාෂාවන්ගෙන් ලියැවී ඇති බුදුසමයට අයත් පොත් වැඩි ප්‍රමාණයක් ද සංස්කෘත භාෂාවෙන් ලියන ලද බුදුසමයට අයත් පොත් ප්‍රමාණයක් ද ගැන විස්තර අඩංගු වෙයි. ඒ අතරට පිටපතේ නම, පෙළට අයත් මුල් කොටස, භාෂාව, භෞතික විස්තරය, පොත් කම්බා විස්තරය, පත් ඉරු ප්‍රමාණය, පත් ඉරුවක ඇති පේළි ගණන ආදිය ඇතුළත් ය. සූත්‍ර සන්න, බණ කථා වස්තු, විනය සහ භාවනාවට අයත් පුස්කොළ පොත් ගැන මෙයින් විස්තර වන්නේ ය. මෙහි උපග්‍රන්ථයේ විෂය නාම සූචිය, කර්තෘ නාම සූචිය, සංඥා නාම සූචිය සහ තවත් විස්තර අන්තර්ගත වෙයි.

Vol. 2 .- vii, 316p.[25] - මෙම වෙළුමෙහි පුස්කොළ පිටපත් 266ක විස්තර අඩංගු වන්නේ ය. ඒවා පාලි සහ සිංහල භාෂාවලින් ලියැවී ඇති බුදුසමයට අයත් නොවන පොත් සම්බන්ධව ය. ආගමික භක්තිය, ඇදහිලි සහ වෘත්තාන්තවලට එම පිටපත් අයත් වෙයි. උපග්‍රන්ථය පළමු කොටස මෙනි.

Vol. 3 .- viii, 318p.[26] - තෙවැනි වෙළුමෙහි පුස්කොළ පිටපත් 250ක ග්‍රන්ථ විස්තර දැක්වෙයි. බෞද්ධ සාහිත්‍යයට අයත් ජාතක කථා, බුදුසිරිත, පූජ්‍යස්ථාන වන්දනා විස්තර කෙරෙන සහ තව ද තොරතුරු ඇතුළත් පිටපත් ඒ අතර වන්නේ ය. උපග්‍රන්ථය සහිතයි.

Vol. 4 .- viii, 465p.[27] - සිවුවන වෙළුම පුස්කොළ පොත් 363ක් ප්‍රධාන කාණ්ඩ පහක් යටතේ වර්ගීකරණ අනුසාරව තොරතුරු සංගෘහිත ය. ඉතිහාසය, ව්‍යාකරණ, කෝෂග්‍රන්ථ, අකාරාදි සහ ඡන්දස් ශාස්ත්‍රයට අයත් පොත් පිළිබඳ විස්තර එහි අඩංගු වෙයි.

Vol. 5 .- viii, 473p.[28] - මෙහි පුස්කොළ පොත් 468ක තොරතුරු අන්තර්ගතයි. ඒවා විෂයන් සතරක් යටතේ වර්ගීකෘතය. ආගමික නොවන පද්‍යය, වෙදකම, ජ්‍යොතිෂය, ශිල්පශාස්ත්‍ර හා කලාව යන ඒවා එයට අයත්ය. උපග්‍රන්ථයේ ග්‍රන්ථනාම සූචිය, කර්තෘ නාම සූචිය සහ සංඥානාම සූචිය ඇතුළත්ය.

Vol. 6 .- viii, 728p.[29] - ප්‍රධාන මාතෘකා දෙකකට අයත් පුස්කොළ පොත් රැසක විස්තර මෙම වෙළුම මගින් තොරතුරු සැපයෙයි. එනම් ලංකාවේ ආගමික චාරිත්‍රවිධි විස්තර කෙරෙන කාව්‍යය පද්ධතීන්ගෙන් යුත් කොහොඹ කංකාරිය සහ පන්තිස් කෝල්මුරකවි පිළිබඳවය. විෂයනාම සූචි, පුද්ගලනාම සූචි, ස්ථානනාම සූචි ඇතුලත් උපග්‍රන්ථයක් ද සහිතයි.

Vol. 7.- 217p.[30] - කේ. ඩී. සෝමදාස මහතාගේ උක්ත විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියේ සත්වන වෙලුම වෙන්වී ඇත්තේ පෙර දක්වන ලද වෙළුම් සය තුළ අන්තර්ගත විස්තර වෙත පහසුවෙන් යොමුවිය හැකි ආකාරයේ තොරතුරු සැපයීම වෙනුවෙනි. වරින්වර ප්‍රකාශයට පත්කර ඇති මෙම වෙලුම් හත ඉතා වැදගත් සේ සැලකිය හැකිය. සම්පූර්ණ කට්ටල පිටපත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ සහ ජාතික පුස්තකාලයේ ද තිබෙයි.

Catalogue of Palm leaf manuscrirpts in the University of Ceylon Library, Peradeniya. ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය

පුස්තකාලයෙහි පුස්කොළ පොත් ග්‍රන්ථ නාමාවලිය. එම්. එම්. පී. ඩී. උඩුගම විසින් 1972 වර්ෂයේ දී සම්පාදනය කරන ලද මෙම ලේඛනය මුද්‍රණය සඳහා සැකසූ අත්පිටපතට කොළ 390ක් අයත් බව සඳහන්ය. එම පුස්තකාලයේ තිබෙන පුස්කොළ පොත් 4388ක විස්තර එකී විස්තරාත්මක නාමාවලියේ අන්තර්ගත වන්නේය.

Descriptive catalogue of the Pali manuscrirpts in the Adyar library.
Madras, The Adyar library (Theosophical Society), 1947. xxxi, 111,6p. [31]

ආචාර්ය ඊ. ඩබ්ලිව්. අධිකාරම් මහත්මා විසින් සම්පාදන කරන ලද මෙම විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියට අයත් වන්නේ දකුණු ඉන්දියාවේ මදුරාසි (වර්තමාන චෙන්නායි) නගරයේ පිහිටි අද්යාර් පුස්තකාලය සතු ත්‍රිපිටක පුස්කොළ පොත් එකතුවයි. සම්පූර්ණ පෙළ සහ අටුවාව සහිත මේ පුස්කොළ පොත් එකතුවෙහි මුල් අයිතිය ලංකාවේ දකුණු පළාතේ මාතර දානපති උපාසිකාවක වූවාය. එවකට කර්නල් ඕල්කොට්තුමා ලද එකී පරිත්‍යාගය උක්ත පුස්තකාලයේ තිබෙයි. පිටපත් 47ක් සහිත මෙම එකතුවට පත්තිරු 24156ක් අයත් වෙයි. පෙළට සහ අටුවාවට අයත් සියලුම පිටපත් පිළිබඳව ග්‍රන්ථ විස්තර මෙහි සඳහන් වෙයි. ඒ ඒ පිටපත්වල පත්තිරු ගණන, අක්ෂර, අංකන ක්‍රමය, පත්තිරුවක දිග පළල, ආරම්භක පෙළ කොටසක් සහ පෙළෙහි අවසාන කොටස ද රෝමන් අක්ෂරයෙන් දැක්වෙයි.

මෙම ග්‍රන්ථ නාමාවලියෙන් විස්තර කෙරෙන පරිදි ත්‍රිපිටක ධර්මයෙහි සංයුතිය මෙන් ම පෙළට ලියන ලද ඒ ඒ අටුවවේ නම ද දැනගත හැකි ය. ත්‍රිපිටක, අටුවා අධ්‍යයන සහ සංස්කරණ කාර්යයේ නිරත වන පර්යේෂකයින්ට මෙම මූලාශ්‍රය අනුව කදිම යතුරක් විය හැකි ය.

පුස්කොළ පොත් සම්බන්ධයෙන් පළව ඇති තව ද විස්තරාත්මක ග්‍රන්ථනාමවලි කීපයක් තිබෙයි. BIBLIOGRAPHY ON PALM LEAF MANNUCRIPTS IN SRI LANKA; NATIONL LIBRARY

AND DOCUMEN´ION CENTRE 2007 යන ප්‍රකාශනයට අනුව ඒවායෙන් කීපයක් මතු දක්වනු ලබන බව සැලකුව මැනවි.

Bandall, Cecil.
Catalogue of the Sanskrit manuscrirpts in the British Museum. London, printed by order of the Trustees. Sold at the British Museum, and by Longman & Co. etc., 1902. vii, 261p. + Arranged by subject grouping s. Indexes of titles & authors and a general index.

Cabaton, Antoine
Catalogue sommaire des manuscrirpts Sanscrits et Palis. 1 er face. -Manuscrirpts Sanscrits. Paris, Bibliotheque Nationale, 1907. (5) 189p. (1102 entries)

---Catalogue sommaire des manuscrirpts Sanscrits et Palis. 2 e face.-
ManuscrirptsPalis. Paris, Bibliotheque Nationale, 1908. 195p.
719 entries, pp. 1 - 153; Papiers d' Eugene Burnouf
(124 entries), pp. 154 - 174; Papiers de Leon Feer
(20 entries), pp. 175 - 177.Title index.

Catalogue of the Sinhalese manuscrirpts in the India Office Library / ed. C. H. B. Reynolds, K. A. S. Wijayarathne and A. S. Kulasuriya.- London : India Office Library, 1981.- vi, 72p.

Colombo Museum
Catalogue of theColombo Museum Library. Pt . 1 -Pali,Sinhalese & Sanskritmanuscrirpts.Colombo, 1892. (2), 18p. (261 items).+ The Librarian during this period was F. H. M. Corbet and The Director, Amyrald Haly.

De Alwis, James
A descriptive catalogue of theSanskrit,Pali& Sinhalese literary works of Ceylon /JamesDe Alwis.- Colombo : William Skeen (Govt. printer), 1870.- Vol. 1, xxx, 243p.

De Silva, P. H. D. H.
Acatalogue of antiquities and other cultural objects from Sri Lanka (Ceylon) abroad/ P. H. D. H.De Silva.- Colombo : National Museumof SriLanka, 1975.- v, 506p.

De Silva, W. A.
Catalogue of Palm leaf manuscriprts in the library of the Colombo Museum/ W. A.De Silva.- Colombo :Colombo Museum, 1938.- Vol. 1,xxxiv, 412p. : 6 plates.- (Memoires of the Colombo Museum series : A, No. 04).

De Zoysa, Louis
Catalogue of Pali,Sinhalese &Sanskrit manuscriprts in the Ceylon Govt. Oriental Library/ LouisDe Zoysa.- Colombo : George J. A. Skeen,
(Govt. printer), 1882.- 26p.

Liyanarathne, Jinadasa
Catalogue of manuscriprts Sinhalais/ ed. Jinadasa Liyanarathne.- Paris : Bibliotheque Nationale, 1983 .- 148p.

Perera, Dionysius Mudaliyar.
A Catalogue of Pali and other manuscriprts in temples in the tangalla district. Communicated through Lt. - Col. W. M. G. Colebrooke
and read at the General Meeting of the Royal Asiatic Society (G. B. & I .) on May 5, 1832. This, perhaps the earliest catalogue of Ceylonese mss.to be compiled, remained unpublished, and the manuscriprt is missing from the Society's collections now.
Wickremasinghe, Don Martino De Zilva.

Catalogue of Sinhalese manuscriprts in the British Museum.
Londan. Printed by order of the Trustees, sold at the British Museum and by Longmans & Co. ,ect., 1900. xxxiii, 199p.
+ Preface by Robert K. Douglas. The entries are aranged by subject

groupings, with indexes of proper names, titles and subjects.

පුස්කොළ පොත් පිළිබඳ තොරතුරු මූලාශ්‍රයයන් බොහෝ පවතින බැවින් නිදසුන් කීපයක් පමණක් මෙහි දක්වන ලදී. එසේ ද දක්වනලද්දේ ග්‍රන්ථනාමාවලි සහ සවිස්තරාත්මක ග්‍රන්ථනාමාවලි ආශ්‍රයෙන් පමණි. තව ද ලැයිස්තු, වාර්තා, වාරසඟරා ලිපි, සූචි සහ වෙනත් ලේඛන ආශ්‍රයේ ද මේ ක්ෂේත්‍රයෙහි තොරතුරු මූලාශ්‍ර බොහෝ තිබෙයි. තව ද බලන්න, ශ්‍රී ලංකාවේ පුස්තකාල පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය / BIBLIOGRAPHY OF PALM LEAF MANUSCRIPTS IN SRI LANKA, සම්පාදනය, ප්‍රලේඛන සේවා අංශය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, කොළඹ ; 2007.

**ආන්තික සටහන්**

1. අමරසිරි, ජී.ඩී.- **තොරතුරු සාක්ෂරතාවය,** කර්තෘ ප්‍රකාශන, මඩපාතඃ 2004. පිටු. 1 - 2.
2. තොරතුරු සහ තොරතුරු ගවේෂණය, **අමරවීර, ජේ.ඒ.- පුස්තකාල හා විඥාපනවිද්‍යා ලේඛන සමුච්චය,** පුස්තකාල හා විඥාපනවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දලුගමඃ 2005. පි. 64.
3. තොරතුරු සහ තොරතුරු ගවේෂණය, **අමරවීර, ජේ.ඒ. - පුස්තකාල හා විඥාපනවිද්‍යා ලේඛන සමුච්චය,** පුස්තකාල හා විඥාපනවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දලුගමඃ 2005. පි. 64.
4. ජාතික පුස්තකාල සේවා හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථාන චක්‍රලේඛ අංක 2004 -පුස 1 ( 2016 සංශෝධිත).
5. පැරණිම සිංහල පුස්කොළ පොත්, ප්‍රනාන්දු, පී.ඊ.ඊ. පුරාවිද්‍යා, **සංස්. සිරිසමන් විජේතුංග, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ : 1989. පි. 8.**
6. විමලරත්න, කේ.ඩී.ජී, **පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය,** ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1989. පි. 5.
7. නූතන ලංකාවේ පැරණිම පුස්තකාලයක වර්ධනය, **තිස්ස කාරියවසම්,** විමල් අභයසුන්දර සම්ප්‍රාදනය, සංස්. අමරහේවා මද්දුම සහ තවත් අය.... සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ : 1994. පි. 27-36.
8. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය/ BIBLIOGRAPHY OF PALM LEAF MANUSCRIPTS IN SRI LANKA, සම්පාදනය, ප්‍රලේඛන සේවා අංශය, ජාතික පුස්තකාල හා

ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, කොළඹ ; 2007.
9. සංස්කාරක, කේ.ඩී. සෝමදාස, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ: 1959.
10. අස්ගිරි උපත, සංස්කාරක, තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමි, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2000.
11. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය / BIBLIOGRAPHY OF PALM LEAF MANUSCRIPTS IN SRI LANKA, සම්පාදනය, ප්‍රලේඛන සේවා අංශය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, කොළඹ; 2007.
12. එම.
13. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය / BIBLIOGRAPHY OF PALM LEAF MANUSCRIPTS IN SRI LANKA, සම්පාදනය, ප්‍රලේඛන සේවා අංශය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, කොළඹ ; 2007.
14. එම.
15. එම.
16. එම.
17. එම.
18. එම.
19. එම.
20. අස්ගිරි මහවිහාරයේ පුස්කොළ පොත්.-1. වයි. කේ. තිස්ස බණ්ඩාර, සාරථී වාර්ෂික සාර සංග්‍රහය, 2008, වෙළුම 06, මධ්‍යම පළාතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි. පි. 16-20.
21. අතීත ස්මරණ-අස්ගිරි මහාවිහාරයීය පුස්කොළ පොත්. වයි. කේ. තිස්ස බණ්ඩාර, සත්සිය වසර සපිරි අස්ගිරිය මහාවිහාරය, සංස්: ආචාර්ය ගොඩගම මංගල හිමි, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, රජයේ මුද්‍රණය, 2012, පි. 167-188 (එම)
22. ජිනරතනාභිනන්දන, සංස්කාරක. ලත්පඳුරේ ඉන්දරතන හිමි, 2016, තිසර ප්‍රින්ටර්ස්. පි. 54-67.
23. වයි. කේ. තිස්ස බණ්ඩාර, (2007) අස්ගිරි මහාවිහාරයීය පුස්කොළ පොත් පිළිබඳ ඓතිහාසික ග්‍රන්ථවිද්‍යාත්මක අධ්‍යයනයක් යන නිබන්ධය. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.
24. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1987.- Vol. 1 .- xi, 439p.
25. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts

in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1989.- Vol. 1 .- xi, 439p.

26. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1990.- Vol. 1 .- xi, 439p.
27. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1990.- Vol. 1 .- xi, 439p.
28. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1993.- Vol. 1 .- xi, 439p.
29. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1993.- Vol. 1 .- xi, 439p.
30. Catalogue of the HughNevill collection of Sinhalese manuscrirpts in the British Library/ K. D. Somadasa.- London : The British Library and the Pali Text Society, 1995.- Vol. 1 .- xi, 439p.
31. Descriptive catalogue of the Pali manu scrirpts in the Adyar library. Madras, The Adyar library (Theosophical Society), 1947. xxxi, 111,6p. 31.